2019 දෙසැම්බර්
7 කාණ්ඩය / 7 කලාපය

දැක්ම

මනුෂ්‍යත්වයෙන් පිරිපුන් මිනිසුන් තනන්නට

සංයුක්ත ගණිත ආචාර්ය
ජනක අබේවර්ධනගේ
නිර්මාණයකි...

ඔබේ ජීවිතය අනුන් සමඟ සැසඳීමෙන් වළකින්න. ඔබ ඔබම වන්න



දලයි ලාමාතුමා සාමය උදෙසාම කැප වූ නායකයෙකි. ප්‍රචණ්ඩකාරී ආක්‍රමණ හමුවේ පවා එතුමා අවිහිංසාවාදී ප්‍රතිපත්තියෙන් බැහැර වූයේ නැත. බෞද්ධ භික්ෂුවක් වශයෙන් සියලු ජනතාවගේ සිතීමේ හා කථා කිරීමේ මූලික අයිතිවාසිකම පිළිබඳ නිරතුරුවම පවසයි. ආගමකට වඩා බුදු දහම යනු මනස පිළිබඳ විද්‍යාවක් ලෙස එතුමා පෙන්වා දුන්නේය. එතුමා පවසන්නේ අප ලෝකය දෙස බලන ආකාරය වෙනස් කිරීමෙන් අපට ලෝකය වෙනස් කළ හැකි බවය.

නඳුන්

වැඩක් කරද්දි වැරදි, අඩුපාඩු සිදුවන එක සාමාන්‍ය දෙයක් හැටියටයි අපි දකින්නෙ. එහෙම වැරැද්දක් සිදු වුණ වෙලාවකදි "වැඩ කරන කෙනා අතිනුයි වැරදි වෙන්නෙ" කියලා අපි හිත හදා ගන්නවා. කොහොමටත් ඉතින් වැඩ නොකර ඉන්නවට වඩා වැරදි සිදු වුණත් වැඩ කරන එකයි වටින්නෙ. සිදුවන වැරදි වලින් පාඩමක් ඉගෙනගෙන ඉදිරියට යන්න හැකියාව ලැබෙන්නෙ එවිටයි.

ඒ වගේම යම් දෙයක් කරන්න උත්සාහ කරන කෙනෙක්ගේ උත්සාහය බිඳ වැටුණු විටෙක මෙවැනි කථා ඇසුරින් ඔහු දිරිගන්වන්නටත් අපි උත්සාහ කරනවා. එහි වරදක් නැහැ. ජයග්‍රහණය වගේම පරාජයත් විඳගන්නට අපට ශක්තිය තිබිය යුතුයි.ඒ නිසා බිඳ වැටෙන උත්සාහය කියන්නෙ පෙරට තැබූ පය ආපස්සට හරවන්න හේතුවක් නෙවෙයි.

වැරදි වෙයි කියලා බයෙන් වැඩ නොකර ඉද්දි වැරදි සිදු නොවෙන බව ඇත්ත. ඒත් ඒකෙන් ලොකු හානියක් සිදු වෙනවා. හරියට වැඩක් කරන්නෙ කොහොමද කියලා ඉගෙනගන්න කවදාවත් ඉඩක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා වැරදි වෙයි කියලා බයෙන් වැඩවලින් මඟ නොහැර, වැරදි වැරදි හරි වැඩ කරන්න ඉගෙන ගන්න.

නිවැරදි කරන්න පුළුවන් වැරදි,කවදාවත් නිවැරදි කරන්න බැරි වැරදි ලෙස එක එක ස්වරූපයේ වැරදි තියෙනවා. තවත් විදියකින් හිතුවොත් හානිය අඩු වැරදි තියෙනවා. බරපතල හානි සිදුවන වැරදි තියෙනවා. මේ මොන ආකාරයේ වරදකින් වුණත්, යම් පාඩුවක් සිදු වෙනවා. මේ පාඩුව අපට පෞද්ගලිකව බලපාන්න පුළුවන්.නැත්තම් අපේ අවට අයට යම් බලපෑමක් කරන්න පුළුවන්.සමාජයට, රටට බලපෑමක් කරන්න පුළුවන්.

අප යම් දෙයක් ඉගෙන ගන්න කල් අපට වැරදි සිදු නොවන ලෙස වැඩ කරන්නට අපහසු වෙයි. ඒත් හැමවිටම අප පුළුවන් තරමින් කටයුතු කළ යුතුයි වැරදීම් අඩුවෙන් වැඩ කරන්නට.

මගේ විශ්වාසයේ හැටියට හරි ප්‍රමිතියෙන් වැඩ කරන අය අතින් වැරදි සිදුනොවෙන තරම්.

ඒ නිසා වැරදි සිදු නොවෙන විධියට හරි ප්‍රමිතියෙන් වැඩ කරන්නෙක් බවට පත් වෙන්නට ඔබ උත්සාහ කළ යුතුයි.

ටෙෂාරි

දැක්ම

2019 දෙසැම්බර්

ප්‍රධාන සංස්කාරක
ජනක අබේවර්ධන

නියෝජ්‍ය සංස්කාරක
අවන්ති කරුණාරත්න

සංස්කාරක
ටෙෂාරි නලින්දිකා කරනායක

පිටු සැලැසුම
ඉන්දික රාමනායක
ira11may@gmail.com

පෙළගැස්ම

සමනලයාය .... 03 පිටුව
හේතු ඵල... .... 04 පිටුව
මඳක් සිතීමට... .... 05 පිටුව
සො ඳුරු සරසවි... .... 06-07 පිටු
පන්හිඳ... .... 08-09 පිටු
මා ආ මාවත... .... 10-11 පිටු
සිතට... / සිහිනයට... .... 12 පිටුවු
ලං කර ගැනීම... .... 13 පිටුව
ඉතිරිය... .... 14 පිටුව
නොනැවතී... .... 15 පිටුව
Story of Determination... .... 16 පිටුවු

දැක්ම

ඉදිරි කලාපය සඳහා ලිපි, කවි පන්ති, නිසඳැස්, කාටූන්, චිත්‍ර බලාපොරොත්තු වෙමු. නම, පාසල, උසස් පෙළ විභාගය ලියන වසර ද සඳහන් කර ඔබේ නිර්මාණ මාතර දැක්ම, ගාල්ල තිග්මා, තංගල්ල මාර්ගා ආයතනයන්හි සවිකර තිබෙන ලිපි බහාලන පෙට්ටියට දමන්න.
කාටූන් චිත්‍ර කළුපාට පෑනකින් ඇඳ තිබිය යුතුයි.

දැක්ම
උසස් අධ්‍යාපන ආයතනය
ආසිරි රෝහල ඉදිරිපිට
ඇළ පාර, මාතර

දුරකථන: 04133415258 / 0412232656

E-mail: dekma.edu@gmail.com
web: www.dekma.lk
www.dekma.edu.lk

නව රැල්ල...

සිරිලක නව පිබිදීමක් ඇතිවී තිබේ. වෙරළ තීර, මං මාවත් පිරිසුදු වනු පෙනෙන්නට තිබේ. පෝස්ටර් අලවා තිබූ තාප්ප පිරිසුදු කර අලංකාර වන අන්දමින් චිත්‍ර ඇඳීමට තරුණ පිරිස් එක්ව සිටිනු පෙනේ. චිත්‍ර ඇඳීමට ස්වේච්ඡාවෙන් චිත්‍ර ශිල්පීන් එක්වනු පෙනේ. තීන්ත ආදී අමුද්‍රව්‍ය සඳහා නොමසුරුව ආධාර කිරීමට පමණටත් වඩා පිරිසක් පෙළගැසෙනු පෙනේ. මේ අපේ රට යන හැඟුම වෙන කවරදාටත් වඩා මිනිස් සිත් සතන් තුළට කාවැදී ඇති බව පෙනේ.

මංමාවත් පිරිසුදු වූ විට, තාප්ප චිත්‍ර වලින් පිරුණ විට දුප්පතුන්ගේ බඩගින්න නිවේද? සමහරු තර්ක කරනු ද ඇසේ.

රටක් දියුණු කිරීම සඳහා අංක එක ලෙස තිබිය යුත්තේ මිනිසුන්ගේ විනයයි. විනය රැකීම සඳහා මිනිසුන්ගේ ආකල්ප නිවැරැදි ලෙස වෙනස් විය යුතු අතර නීතියද ක්‍රියාත්මක විය යුතුය. මේ සඳහා මුදල් වියදම් නොවේ. මුදල් වියදම් නොකර සිදු කළ හැකි එම සංවර්ධනය රටකට ප්‍රථමයෙන් අත්‍යවශ්‍යම වේ.

පිරිසුදු සහ අලංකාර පරිසරයක් හිමි විනයගරුක මිනිසුන් සිටිනා රටක් වෙත සංවර්ධනය ළඟාකර ගැනීම අසීරු නොවේ. තව නොබෝ දිනකින්ම ලොව විශාලතම එළිමහන් කලාගාරය ලෙස මේ සිරිලක එළිය කිරීමට අපේ තරුණ කොල්ලන්ටත්, කෙල්ලන්ටත් හැකි වනු ඇතැයි සිතේ.

ලොව කිසිදු රටකට නොදෙවෙනි ස්වභාව සෞන්දර්යයක් හිමි සිරිලක සෞන්දර්යය තව තවත් ඔප් නැංවීමට තරුණ පිරිස් දායක වන බව දකින විට අනාගතය පිළිබඳ සුන්දර පෙරනිමිති සිතට දැනේ. ලොව නන්දෙස සිටිනා සංචාරකයින්ද වඩ වඩාත් සිරිලක වෙත ආකර්ෂණය කර ගැනීමට තරුණයන්ගේ මේ වැඩපිළිවෙලට හැකි වනු ඇත. එළිමහන් චිත්‍ර පසුබිම් කර ගෙන ඡායාරූප ලබාගැනීමේ රැල්ලක්ද සංචාරකයන් තුළ ඇති වනු ඇත.

මේ සියලු රැලි සමගම මිනිසුන්, අන් මිනිසුන්ට ගෞරව කරන රැල්ලක්ද නිර්මාණය විය යුතුව තිබේ. සතා සීපාවා මෙන්ම ගහ කොළටද, දිය බිඳුවටද, වායු අණුවටද ගරු කිරීමේ රැල්ල ඇති කළ යුතු වේ. රැකියාව අනුව නොව රැකියාව කරන ස්වභාවය අනුව මිනිසුන් උස් පහත් ලෙස සලකන රැල්ල ගොඩනැගිය යුතු වේ. රියැදුරන් මෙන්ම මගීන්ද මහාමාර්ග තුළදී විනයගරුක වන රැල්ල සැදිය යුතුවේ.

දේශීය දේ අගය කරන, දේශීය නිර්මාණකරුවා, නිෂ්පාදකයා ඉහළින් ඔසවා තබන රැල්ලක් තැනිය යුතු වේ. මේ පොළොවෙහි හැදී වැඩෙන සියලු ජාතීන් ශ්‍රී ලාංකික ජාතියක් ලෙස සිතීමේ රැල්ලක් ඇති විය යුතුවේ. එසේ සිතන ජනයා වෙත ජාති භේදයෙන් තොරව ගරු කිරීමේ රැල්ලක් මතු විය යුතුවේ.

ගුවන්විදුලියෙන් අතීතයේ පරිදි දේශාභිමානී ගීත උදේ පාන්දරට අසන්නට සැලසිය යුතුවේ. සියලුම ජාතීන් දේශාභිමානී ගීත මුමුණන රැල්ලක් ඇති කළ යුතුවේ.

මේ රට මගෙ රට
මා ඉපදුණු රට
හැදෙන වැඩෙන රට
මගේම මවු රට...

සියල්ලන් එක්වී රට ගැන හැඟීමෙන් වැඩ කළ හොත් මේ රට ගොඩ දැමීම, කළ හැකි දෙයක් බව විශ්වාස කළ යුතුවේ. මෙම නව තරුණ පිබිදීම සමඟ දේශපාලකතුමන්ලාටද, තව දුරටත් සිතන්නට බොහෝ දේ ඉතිරිව ඇති බව සිතේ.

මෙතෙක් කල් මෙම තරුණ දූ දරුවන්ගේ ජවය කොහේ හංගා තිබුණි දැයි සිතේ. රටට හිතෛෂී මිනිසුන් මේ අලුත් පිබිදීමට ආශිර්වාද සපයනු පෙනෙන්නට තිබේ.

අවශ්‍යතාවය තිබේ නම් එය කළ හැකිය. මම මගේ රටට ආදරය කරමි යන වදන් සිත්තුළ දෝංකාර දේ. රැල්ල කැරැල්ලක් වී අපේ රට සංවර්ධිත ලේබලයට එක් වනු දැකීම අප සැමගේ පැතුම වේ.

මම
සංයුක්ත ගණිත ආචාර්ය
ජනක අබේවර්ධන

හරිම තීරණය ගන්නේ කොහොමද?

ජීවිතයේදී සමහර තීරණ එහෙම ගනිද්දී විකල්ප (Option) කිහිපයක් අතරින් හොඳම විකල්පය තෝරාගන්න සිද්ධ වෙනවා. විකල්ප කිහිපයක් අතරින් හොඳම විකල්පය තෝරාගැනීමට තමයි නිවැරදි තීරණ ගැනීම කියලා කියන්නේ. ජීවිතයේ සමහර ගනුදෙනුවලදී සමහර පුද්ගලයන් ඔබට ඉදිරිපත් කරන විකල්ප අතරින් විකල්ප තෝරා ගනිද්දී ගොඩක් පරිස්සම් වෙන්න ඕන. මන්දයත් කපටි සහ උපක්‍රමශීලී පුද්ගලයන් ඉදිරිපත් කරන විකල්ප කිහිපයේම තියෙන්නේ ඔවුන්ට වාසිදායක වන තත්ත්වයන්. විශේෂයෙන්ම කෙනෙක්ගේ අසරණබවෙන් ප්‍රයෝජන ගන්න හිතන අය දෙපැත්තේම එකම රූපයක් තියෙන කාසි යොදාගෙන කාසියේ වාසිය උරගා බලනවා.

(කැලුම් වැලිගමගේ ජීවිතය වෙනස් කරන කථා කෘතිය ඇසුරිනි)

එක්තරා කාලයක එක්තරා රටක එක්තරා සිටුවරයෙක් සිටියා. මෙයාගේ ව්‍යාපාර කටයුතු දිගින් දිගටම අසාර්ථක වුණ නිසා පොළියට මුදල් ලබාදෙන පොළීකාරයෙක්ගෙන් ණයක් ගන්න හිතුවා. මෙහෙම පොළීකාරයාගෙන් ගත්ත ණය දිගින් දිගටම ගෙවන්න බැරිවුණ තැන සිටුවරයා හොඳටම හිරවුණා. සිටුවරයා දිනෙන් දින ධනයෙන් සහ බලයෙන් පිරිහුණා. මෙහෙම කාලයක් ගතවෙද්දි සිටුවරයා ණය ගෙවාගත නොහැකි තත්ත්වයකට පත් වුණා. මහළු පොළීකාරයා මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න හිතාගෙන අමුතු යෝජනාවක් ඉදිරිපත් කළා.

ඔබගේ ණය පහසුවෙන්ම ගෙවන්න ක්‍රමයක් මම කියන්නම්. මම කැමැතියි ඔබගේ දුව විවාහ කරගන්න. නමුත් කිසිම බලකිරීමකින් නෙවෙයි. මම එයාට විකල්ප කිහිපයක් දෙනවා. ඒක වෙන්නේ මෙන්න මෙහෙමයි. මම අන්න අතන තියෙන මැටි භාජනයට කළු පාට ගල් කැටයකුයි, සුදු පාට ගල් කැටයකුයි දානවා. ඔයාගේ දුව ඒක ඇතුළට අත දාලා එක ගල් කැටයක් ගන්න ඕන. එයා කළු පාට ගල් කැටයක් ගත්තොත් ඔයා ණයෙන් නිදහස් වෙනවා. ඒ වගේම ඔයාගේ ලස්සන දුව මා එක්ක විවාහ වෙන්න ඕන. ඔයාගේ දුව සුදු පාට ගල ගත්තොත් ඔයා ණයෙන් නිදහස් වෙනවා. ඒ වගේම එයා මා එක්ක විවාහ වෙන්න ඕනෙත් නැහැ. ඔයාගේ දුව කිසිම ගලක් තේරුවේ නැත්නම් ඔයා මට ණය ගෙවන්න ඕන. මෙතන කිසිම අසාධාරණයක් නැහැ. අපි දෙගොල්ලන්ටම 50:50 වාසියක් තියෙනවා. සියල්ල සිද්ධ වෙන්නේ වාසනාව අනුවයි. පොළීකාරයා ගනුදෙනුව එලෙස පැහැදිලි කළා.

කරන්න කිසිම දෙයක් නැති තැන සිටුවරයා පොළීකාරයාගේ විකල්ප යෝජනාවට කැමැති වුණා. ඔන්න ගණුදෙනුව නිමාවෙන දවසත් උදාවුණා. පොළීකාරයත්, සිටුවරයාත්, ඔහුගේ දියණියත් නියමිත ස්ථානයට ආවා. පොළීකාරයා කළු පාට ගල් කැටයක් සහ සුදු පාට ගල් කැටයක් සිටුවරයාට සහ දියණියට පෙන්නලා ඒ දෙකම අර මැටි භාජනයට දැම්මා වගේ පෙන්නුවා. නමුත් පොළීකාරයා පුංචි නෙවෙයි ලොකු හොරයක් එතනදී කළා. කපටි පොළීකාරයා ඔවුන්ට කළු පාට ගල් කැටයක් සහ සුදු පාට ගල් කැටයක් පෙන්නලා කළු පාට ගල් කැට දෙකක් පමණක් භාජනයට දැම්ම බව සිටුවරයාගේ දියණිය දැක්කා. ඇයත් පොළීකාරයාට රැවටුණ සේ හැසිරුණා. නමුත් ඇය සුපරික්ෂාකාරීව පරිසරය විමසීමට ලක් කළා. එහිදී ඇයට හොඳ උපක්‍රමයක් මතක් වුණා.



හිතන්න එම තරුණිය ඔබ නම්, ඔබ පොළීකාරයාගේ ගැටයෙන් ගැලවෙන්නේ කොහොමද? ඔහු සිදුකළේ බොරුවක් කියලා කියනවාද? නැත්නම් කළු ගල් කැටයක් අරගෙන ඔහුගේ ස්වාමිපුරුෂයා වෙනවාද? ටිකක් කල්පනා කරලා වෙනස් විදියට හිතන්න.

දැන් තියෙන්නේ ඇගේ සහ ඇගේ පියාගේ අනාගතය තීරණය කරන වාරයයි. ඇය මැටි භාජනයට අත දැම්මා. එසේ ඇය භාජනය තුළට අතදාන ගමන් අනිසි කලබලයක් මවාපෑවා. එමනිසා ඇය එම මැටි භාජනය හිතාමතාම වැට්ටුවා. එහිදී ඇය භාජනය ඇතුලේ තිබෙන කළු ගල් කැට දෙකෙන් එක කළු ගලක් අතට අරගෙන කාටවත් නොපෙනෙන්න සඟවා ගත්තා.

අනේ මට සමාවෙන්න. මම කලබල වුණා. මම අතට ගත්ත ගල් කැටය බිම වැටුණා. ඇය ඉතාම ආයාචනාත්මක ස්වරූපයෙන් එහෙම කිව්වා. පොළීකාරයා වටපිට බැලුවා. ඔවුන් එම ක්‍රියාව සිදු කළ තැන බිම තවත් සුදු සහ කළු ගල් කිහිපයක්ම තිබුණ නිසා පොළීකාරයා අන්ද මන්ද වුණා.

දැන් කොහොමද ඔයා ගත්ත ගල තීරණය කරන්නේ? පොළීකාරයා ඇහුවා

ඒක හරිම ලෙහෙසියිනේ. මම ගත්ත ගල තමා බිම වැටුණේ. ඉතිරි එක භාජනයේ ඇති. අපි බලමු භාජනයේ ඉතිරිවෙලා තියෙන්නේ මොන ගල් කැටයද කියලා ඇය කිව්වා.

ඇය එලෙස කියමින් භාජනයේ දැනටමත් ඉතිරිවෙලා තියෙන කළු පාට ගල් කැටය අරගෙන පෙන්නුවා. පොළීකාරයාට සිදුවුණ දෙය ගැන ඔහුට හිතාගන්නත් බැහැ. ඇය සුදු ගල් කැටයක් ගත්තොත් ඇයගේ පියා ණයෙන් නිදහස් කරන අතරම ඇයට මහළු පොළීකාරයා සමඟ විවාහ වෙන්න සිදු නොවන බවටත් එකඟවෙලා තිබුණා. ඉතින් ඔවුන් බේරුණා.

ජීවිතයේදී විකල්ප අතරින් හොඳම විකල්පය තෝරාගන්න අවශ්‍ය අවස්ථා දිනෙන් දින ජනිත වෙනවා. බොහෝ වෙලාවට අප අසරණ වෙලා ඉන්න අවස්ථාවක ඉන් වාසි ගන්න හිතන අය අපට ඉදිරිපත් කරන්නේ ඉහත ආකාරයේ කූට විකල්පයන්. නමුත් මනාව කල්පනා කරලා වැඩ කළොත් ඕනෑම කෙනෙක්ගේ ඕනෑම කූට විකල්පයකින් ගැලවෙන්න පුළුවන්.

හේතු ඵල

දිදුල කවීෂ සමරවීර / සාන්ත තෝමස් කුමර විදුහල /2019 A/L

A/L කඩඉම ජයග්‍රහණය කළ වැඩිහිටියෙක්ගෙන් අපි A/L මුල් කාලෙදි අහන පොදු ප්‍රශ්න තමයි, කාගෙ පන්තිද යන්න ඕනේ? කොහොමද අපි වැඩ කරන්න ඕනේ? මේ කඩඉම ජයගන්න විශේෂයෙන් අපි කරන්න ඕන දේවල් මොනවද?

එතකොට සාමාන්‍යයෙන් ලැබෙන පිළිතුර තමයි දැඩි අධිෂ්ඨානයෙන් ,උත්සාහයෙන් තනිවම වැඩ කළොත් ලේසියෙන්ම ගොඩ යන්න පුළුවන්. පුළුවන්තරම් තනියම වැඩ කරන්න.

ඔව් ඒක තමයි ඇත්ත. ඒ ගැන තර්ක දෙකක් නැහැ. ඒ වුණාට A/L කාලෙදි කොච්චර වැඩ කළත් ඒ වැඩ කරපු තරමට ප්‍රමාණවත් තරමේ ප්‍රතිඵල ලබාගන්න බැරිවෙන පිරිසකුත් නැතුවාම නෙවෙයි. මොකක්ද මේකට හේතුව, බුද්ධියේ අඩුවක්ද? කැපවීමේ අඩුවක්ද? එහෙමත් නැත්නම් දෛවයේ සරදමක්ද? අවාසනාවද?

ඇත්තටම මොකක්ද මේකට හේතුව?

යම් ඵලයක් ලැබීමට නම් අනිවාර්යයෙන් ඊට මුල් වූ හේතු ඵල පැවැත්මක් තිබියි යුතුයි. බුදු දහමේ මෙය හොඳින් පැහැදිලි කරනවා.

හොඳ ප්‍රතිඵලයකට හේතු වන කරුණු තමයි, තනිවම විෂයයන් හොඳින් අධ්‍යයනය. ඒ වුණාට ටිකක් ගැඹුරින් හිතුවොත් මේ නිර්දේශයන් තනිව අධ්‍යයනය කරන්න අවශ්‍ය දැඩි කැපවීම, අධිෂ්ඨානය, උත්සාහය, සත්‍ය වශයෙන්ම ඵලදායී වෙන්නේ තමන් කරන ඒ දේ දැඩි ආශාවකින්, කැමැත්තකින් කළොත් විතරයි. ඒ කියන්නේ තමන් කරගෙන යන අධ්‍යාපනය, ආශාව හේතු කොටගත් අධිෂ්ඨානය නිසා කරගෙන යන කටයුත්තක් විය යුතුයි. ඒක විෂයය කරුණුවලට හෝ ඉදිරි අනාගතය වෙනුවෙන් ඇති ආශාවක් විය හැකියි. නමුත් වඩා හොඳින් අධ්‍යයන කටයුතු කරන්න විෂයයට ඇති ආශාව තදින්ම බලපානවා. ඔයගොල්ලටන්ට දැනටමත් ඊට හොඳ අත්දැකීම් ඇති.

උදාහරණයක් ගතහොත් අපිට ජනක සර්ගේ ක්ලාස් එකේ පළවෙනි දවසේ A/L කරන්න පට්ටම Moral එකක් දෙනවා. ඒ වුණාට කාලයත් එක්ක විෂයයට තියෙන ආශාව වෙන වෙන දේවල් වලට ගියාම ඒ සීඝ්‍රතාවය, අපේ අධිෂ්ඨානය ඔක්කොම දිය වෙලා යනවා. ඒ වගේ ඕනතරම් උදාහරණ දෙන්න පුළුවන්.

ඊළඟට අපිට එන ලොකුම ප්‍රශ්න තමයි කොහොමද ආශාව ඇති කර ගන්නේ, පවත්වා ගන්නේ?

මට මතකයි අපේ අක්කා A/L කරන කාලේ මම මේ ටික අක්කට කිව්වම අක්කා කළේ ළඟම තිබුණ පොතක් බදාගත්ත එක. ඇත්තම කිව්වොත් ආශාව, කැමැත්ත හිත ඇතුලෙන්ම එන දෙයක්. මොළය විසින් ඒක ආයාසයකින් හිතේ ඇති කරන්න බැහැ.

ඒ වුණාට හැම දේකටම විසඳුමක් තියනවනේ. මේකට හේතු ඵල දහමෙන් විසඳුමක් සොයන්න පුළුවන්. ඒ තමයි අපිට ඇති වන ආශාව, නැති කරවන හේතු නැති කිරීම.

ඊළඟට එන ප්‍රශ්නය තමයි ඒක නැති කරන්නේ කොහොමද? ඒක උදාහරණයකින් පැහැදිලි කළොත්, හිතන්න හැම තිස්සෙම අවුල් වෙලා තියෙන කාමරයක, මේසයක මොන මිනිහටද ආසාවෙන් වැඩ කරන්න පුළුවන්. ඔයාලට මතකද මුලින්ම වැඩ කරන්න තැනක්, මේසයක් හදලා දුන්න දවසේ වැඩ කරන්න තිබුණු ආසාව? ඒ වගේම තමයි අමාරු ගණනක් හදනකොට මුළු කොලේ පුරාම කපල කොටලා පටන් ගත්තොත් වැඩේ එපාම වෙනවා නේද?

ඒ වගේ තමයි අපේ වැඩ කරන්න තියෙන ආසාව නැතිකරගන්නෙත් අපිමයි. Mobile Phones, Computer Games, Movies, Dramas කියන්නේ විෂයයට තියෙන ආශාව උදුරගන්න දේවල්. මේ වගේ තවත් හේතු තියෙනවා. අපිට A/L ජීවිතේම එපා කරවන. මේවා හඳුනාගත යුතුයි. නැතිකරගත යුතුයි.



> ‘ඇත්තම කිව්වොත් ආශාව, කැමැත්ත හිත ඇතුලෙන්ම එන දෙයක්. මොළය විසින් ඒක ආයාසයකින් හිතේ ඇති කරන්න බැහැ.’

> **The only way to do a great thing is to love what you do**
>
> *- Steve Jobs*

A/L වලට විතරක් නෙවෙයි තමන් කරන කියන ඕනෑම කටයුත්තකදී මවුපියන් කියන නිසාවත්, වෙන කරන්න දෙයක් නැති නිසාවත් කරනව නම් ඊට ලැබෙන ප්‍රතිඵල අල්පයි. ඒ කටයුත්ත දැඩි කැමැත්තකින්, ආශාවකින් කරනවානම් ඉන් අපට ලැබෙන ප්‍රතිඵලය අති මහත් .ආශාවෙන් වැඩකට බැස්සොත් ඔහුට නිදිමත, කම්මැලිකම යනු හුදෙක් වචන පමණක් වනු ඇත.

The only way to do a great thing is to love what you do - Steve Jobs

සසර ගමනේ සදාකාලික සැප පිණිස නැතිකළ යුතු එකම දෙය ආශාව බවද මතක තබා ගන්න.

නැති බැරි කමක් මට නොදෙනෙන නියාවෙනී
දුක් කරදර මැදින් මා හැදු දයාවෙනී
හොඳ දරුවෙක් වෙයන් මට දුන් ඔවාමිණී
ඔබ පා යුග වඳිමි ආදර මෑණියනී

මඳක් සිතීමට... අම්මා ගැන

සෙනෙහස, ආදරය නොඅඩුව දක්වමින් ඇස් දෙක වගේ ඔබව බලා ගන්න මෑණියන්ට ඔබ යුතුකම් ඉටුකළාද? මඳකට ඔබේ දෑස් විවර කරන්න. අපි දැන් කර දඬු උස් මහත් වෙච්ච අය. ඔයා හිතන් ඉන්නේ ලොකු මිනිහෙක් කියලද? නෑ අපි තාමත් අම්මගේ සෙනෙහස, ආදරය ලඟ ආදරණීය වෙන්න පුළුවන් පුංචි දරුවෝ. අපිට ආයෙත් සැරයක් අම්මගේ ආදරය ලඟ , අම්මගේ ලෝකය ළඟ සැනසෙන්න බැරිද?

ඔබේ දඟකාරකම, විසේකාරකම මොහොතක් පැත්තකට තියලා ඔබ ඔබෙන්ම අහන්න ඔබේ රත්තරන් අම්මට යුතුකම් ඉටුකළාද කියලා. ඔබ ඔබේ අම්මගේ, අප්පච්චිගේ සෙනෙහස ගැන සිතුවද? ඔබ මඳක් සිතා බලන්න. මේ ලෝකේ අප වෙනුවෙන් කඳුළු වට්ටපු දෑසක් තිබුණානම් ඒ වෙන කාටත් නෙවෙයි ඔබේම අම්මටයි. අම්මාගෙන් වැටුණු හැම කඳුලක්ම ඒ දරුවන්ගේ ලෝකය වෙනුවෙන් පූජා වේවා.

මේ ලෝකේ අප වෙනුවෙන් එක දෑසක් තිබුණනම් ඒ වෙන කාටවත් නෙවෙයි. ඒ ඔබේ අම්මටයි. අද කර දඬු උස් මහත් වුණාට අමතක කරන්න එපා පුංචි කාලේ ඔයා ඇඳේ නිදි කරලා ඔයාගෙ ඇස් දෙක දිහා නින්ද යන කල් බලන් හිටපු, මේ ලෝකේ නිදි වරාගෙන අපේ නින්ද ප්‍රාර්ථනා කරපු එකම උත්තමාවිය ඔයාගේ අම්මා.

මගේ රත්තරන් පුතේ රජෙක් වෙයන් කියලා ඔයාට ලෝකය දුන් එකම කෙනා අම්මයි. අම්මා තරම් මේ ලෝකයේ දුක් විඳපු කෙනෙක් නැහැ. අම්මාගේ විශ්මිත නිර්මාණය මේ ලෝකයේ කිසිම ආගමික නායකයකුට කරන්න බැරි වෙච්ච එකක්. අම්මා කියන්නේ මහා බ්‍රහ්මයෙක්, අමමා කියන්නේ මහා විශ්වකර්මයෙක්.

ඇයි මගේ අම්මට මහා බ්‍රහ්මයා, විශ්වකර්මයා කියලා කියන්නේ. මේක කියවන ඔබට දැනෙන්න ඕන අම්මට එහෙම කියන්නේ ඇයි කියලා. අපි අම්මාගේ කුසට ආ දවසේ සිට සැර කෑමක් කන්නේ නැතුව, උෂ්ණ කෑමක් කන්නේ නැතුව, බරක් උස්සන්නේ නැතුව මහා පුදුම සෙනෙහසකින් දරු ගැබ රැක්කේ.

ඒ කාලේ අම්මට හරි ආසයි ඇඳේ එහාට මෙහාට පෙරළි පෙරළී නිදාගන්න. ඒත් දරු පැටියට රිදෙයි කියලා මාස නවයක් අම්මා පරිස්සමට නිදා ගත්තේ එක පැත්තකට. අපිව කුසේදිවත් රිද්දලා නෑ. කුසේදිවත් තමන්ට රිද්දපු නැති ඒ බුදු අම්මට අද සමාජයේ ළමයි කොතරම් රිද්දනවද? ඒ බුදු අම්මට කවදාකවත් දුක් දෙන්න එපා.

ඔයා දන්නවද අම්මගේ පෙකෙනි වැලෙන් අපිව වෙන් කරපු දවසේ නූතන තාක්ෂණය පරයන විශ්මිත නිර්මාණය කළේ එදා තමයි. අම්මගේ පපුව උඩින් අපි තියද්දි මේ ලෝකේ කිසිම කෙනෙකුට කරන්න බැරි විශ්මිත නිර්මාණයක් කෙරුණා. එතකොට ඔයා වෙනුවෙන් වැඩියෙන්ම ආදරය කළේ කවුද? ඔබම සිතන්න.

අම්මාගේ පපුව උඩ ඔයාව තියද්දි අම්මගේ රතු ලේ බිංදු කිරි වුණා.

> **පෙකෙනි වැලෙන්**
> **වෙන් කරලා**
> **අම්මගේ**
> **පපුව උඩින්**
> **අපිව තියද්දි**
> **මේ ලෝකේ**
> **කිසිම කෙනෙකුට**
> **කරන්න බැරි**
> **විශ්මිත**
> **නිර්මාණයක්**
> **කෙරුණා.**

බලන්න ඔබේ දෑස් විවිර කර, ඔබේ අම්මගේ මූණ දිහා. දස අතේ ණය වෙලා අපිව පංති යවලා අම්මා හිතන් ඉන්නේ ඔයා ලොකු මහත්තයෙක්, ලොකු නෝනා කෙනෙක් වෙයි කියලා. ඒ නිසා ඔයා ඔයාගේ රත්තරන් අම්මගේ සිහින බොඳ කරන්න එපා. ඇය වෙනුවෙන් අප ජීවිතය ජය ගත යුතුයි.

ඔයා පොඩ්ඩක් හදවතට තට්ටු කරලා අහන්න ඔයාට කලින් අම්මා බත් කනවද කියලා, ගෙදර බත් හැලිය හදලා දරු පැටවුන්ගේ පිඟන්වලට බත් බෙදලා, අප්පච්චිට බත් බෙදලා දෙයිහාමුදුරුවනේ අම්මා කෑවේ හැලියේ දංකුඩ. අම්මා කවදාවත් උඩින් බත් ටික කෑවේ නැහැ. හැමදාම කෑවේ බත් දංකුඩ බෙදා ගෙන. අම්මා දීපු කිරිවල ණය අවුරුදු සීයක් අම්මා දකුණු උරහිසේ තියන් හිටියත් ගෙවන්න බෑ කියලා අප ලොවුතුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර තියෙනවා.

මගේ යාළුවනේ අද සමහර ළමයි කේන්ති ගියාම අම්මට කථා කරන්නේ අම්ම නම් මහා කරුමයක් කියලා. රතු ලේ සුදු කරපු අම්මව ඒ ඩිංගට ඔයාට අමතක වුණාද? රතු ලේ සුදු කළ ආදරණීය බව කවමදාකවත් අමතක කරන්න එපා. ඒ කිරි සුවඳට පරිභව කළ පුතු නිරයේමයි උපදින්නේ .කවදාවත් ඔයාගේ අම්මට දුක් දෙන්න එපා මගේ යාළුවනේ.

අද සමාජය දෙස බැලූවිට පාරක් පාරක් ගානේ අම්මලා දාලා යනවා. අසරණකමින් ඔවුන් හඬා වැටෙනවා. පව් යාළුවනේ, කවදාවත් එවන් ලෝකයක් බිහි කරන්න එපා.

අම්මා වෙනුවෙන් කළ යුතු යුතුකම් උපරිමයෙන් ඉටු කරමු.

අපේ ලෝකේ මවුපියන් කියලා හිතනවා නම් ඔබේ ජීවිතය වෙනස් වනු නොඅනුමානයි.

ඒ. පී. එච් පවන් ලක්මාල්
මො/කුමාරදාස ම. වි.
2019 A/L

රොබරෝසියා මල් සුවඳේ වෙලෙන්න
ගොඩ දෙවියන් වැඳ ආසිරි ලබන්න
නුග ගහ යට සිල් සිසිලේ තෙමෙන්න
කොළඹ එන්න ඒ සිහිනය දකින්න

උසස් පෙළ විභාගයත් ඉවර වුණා. ප්‍රතිඵලත් ආවා. දැන් ඉතින් කැම්පස් යන්න තියෙන්නේ. බලාපොරොත්තු වුණු විදියට ගෙදරට ලියුමක් එනවා කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයෙන්. ඔන්න ඉතින් හිතේ තිබ්බ හීන ටික පොදි බැඳන් කැම්පස් යන්න නොඉවසිල්ලෙන් බලන් ඉද්දි ලියාපදිංචි වන දිනය ආවා. උදේ පාන්දරින් අම්මලා එක්ක කොළඹ ගියේ ටික්ක විතර බයෙන්. මොකද නුපුරුදු පළාතක, නුපුරුදු තැනක තනියම ජීවත් වෙන්නනේ අපි යන්නෙ.

සතියක කාලයක් පුරා පවත්වපු Orientation එකෙන් පස්සේ English & Tamil Courses මාසයක් පුරා අපට හදාරන්න පුළුවන් වුණා. Tamil Exam එකත් ලිව්වා. ඔන්න ඉතින් දැන් අපි කැම්පස් ජීවිතේ ලබන රසම රස, සොඳුරුම දවස එළඹුනා.

සොඳුරු සරසවි මතක

කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨය

සොඳුරු සැඳෑවේ නුග ගහ යට අපේ පුංචි සාජ්ජේ. අපේම යාළුවෝ ගයනවා, වයනවා. රස සාගරයයි එදා සැන්දෑව. ඊට පස්සේ ඉතින් අපිට Academic පටන් ගන්න තියෙන්නේ.

Colombo science කියන්නේ ජීව විද්‍යාව (Bio) , අනුක ජීව විද්‍යාව (mb) , කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය (IS) සහ භෞතීය විද්‍යාව (Physical Science) හැමෝම ඉන්න තැනක්. එයින් Physical Science අපි තමයි බැජ් එකේ බහුතරයක් ඉන්නේ. Applied Maths & Computer science පොදු විෂයයන් දෙකක් වන අතර Chemistry, Statistics, Physics & Pure වලින් විෂයයන් දෙකක් තෝරා ගන්න පුළුවන්.

ඔන්න හා හා පුරා කියලා පළවැනි අභියෝගය Seniors ලා අපිට භාර දුන්නා. මොකක්ද දන්නවද ඒ, Science Faulty එක පිට පිට අවුරුදු තුනක් දිනපු Fresher's Match වල 1st Place එක රැක ගන්න එක. ඒක හිතන තරම් ලේසි දෙයක් නම් වුණේ නැහැ. Faulty නවයක් එක්ක කරට කර තරග කරන්න අපේ කෙල්ලෝ, කොල්ලෝ හරි හරියට පුහුණුවීම්වල නිරත වුණා. කොහොමින් කොහොම හරි අපි 1st Place එක රැක ගෙන ඉන්න අතරේ අවුරුදු නිවාඩුව Set වෙනවා.

අවුරුදු නිවාඩුවෙන් පස්සේ කරන්න තවත් ලොකුම ලොකු වැඩක් අපිට බාර වෙලයි තිබුණේ. ඒ තමයි Science Faculty එකටම බඩ පිරෙන්න කන්න දෙන්න අවුරුදු කෑම මේසයක් සූදානම් කරන එක. මේ ඔක්කොම ලෑස්ති කරන් April 22 Campus පටන් ගන්න තියෙද්දි අපි හැමෝම නොහිතපු විදියේ අවාසනාවන්ත

අත්දැකීමකට රටම මුහුණ දුන්නා. අප්‍රේල් 21 ඒ සිදුවීමෙන් ඇති වුණ රටේ නොසන්සුන් තත්ත්වය නිසා Fresher's Matches තාවකාලිකව නැවතුණා. දුකයි තමයි. ඒත් මොනවා කරන්නද? ඒත් දැන් අපිට ආයෙත් සතුටු වෙන්න පුළුවන්. ළඟදීම Fresher's Matches Continue කරන්න, තීරණය කරලා තියෙනවා.

නුරාන්, අශේන්, වරුණ, නදීෂා මෙන්න මේ වගේ නම්වලින් කැම්පස් ආව අය දැන් බින්නා, අණ්ඩා, සතා, ලීසා යන නම්වලින් කැම්පස් එකේ ප්‍රසිද්ධ වෙලා. උප්පැන්නේ නම අමතක වෙන තරමට අපිට දැන් ඒ නම් හුරුයි.

Academic ඇරුණම Club බොහොමයක් තියෙනවා අපිට join වෙලා වැඩ කරන්න පුළුවන්. Leo, Rota, Aisec වගේ සමාජ සේවා Club වගේම Astronomy, Stat Circle, Robotics, Physics Society & Gavel වගේ අධ්‍යාපනික Club එහෙමත් ගොඩක් තියෙනවා. ඒ වගේම සෞන්දර්ය හැකියා තියෙන අයට Euphony වගේ Club වුණත් Science Faculty එකේ තියෙනවා.

Subject එකක් විදියට Physics කරලා Astronomy Engineering Physics, Robotics වගේ පැති වලට යන්න පුළුවන්. Statistics Subject එකක් විදියට කරලා ඉස්සරහට ගියොත් ලංකාවේ ගොඩක් Company වලට යන්න Opportunity අපිට ලැබෙනවා. ඒ වගේම Data Science පැත්තට යන්නත් ඔබට පුළුවන්. Engineering යන්න බැරි වුණා කියලා දුක් වෙන්නේ නැතුව අනාගතේ සාර්ථක මාවතක් දිගේ යන්න Colombo Science එක තුළින් පුළුවන්.

රැජිණ වලව්ව පහු කරන්, පෙන්ටගනයෙන් ඇතුල්වෙලා, නුවරඑළිය ළඟ තියෙන ඇරපු එකෙන් උදේට බඩ පුරවන්, නුග ගහ පහු කරන් Lectures ගිහින් Free වෙලාවට පොදු එකට වෙලා ඕමියක් ගහන් Set එකත් එක්ක හවානා එකෙන් Juice එකක් බීලා, ගොඩ දෙවියන්ට භාර වෙලා ගොඩ යන්න ඔබත් එන්න Colombo Science Faculty එකට. සරසවි සිහිනය කොළඹින් දකින්න ඔබත් එන්න කොළඹ සරසවි බිමට.

මතකයි තාත්තේ...

මතකයි තාත්තේ නුඹ
සෙව්වා නිත
ගොස් වැඩට ආ විගස
ඇස් දුවයි මා වෙතට

වෙහෙස නොබලා
මාව වඩාගෙන තුරුළුකර
දුන්න හැටි රස කෑම
සිහිවෙයි එදා මෙන් අද...

සිහිවෙද්දි නුඹේ වත
උනයි කඳුලැලි නෙතට
නමුත් බැහැ හඬන්නට
නුඹට දුක හිතෙනා නිසා මට...

එදා මෙන් අදත් මම
ගරු කරමි ඔබෙ නමට
ආදරෙයි හැමදාම
නුඹේ දියණිය නුඹට

A. සචින්දි යසාරා
2k20 A/L
STG

Don't worry about getting old, worry about thinking old



සමාව යනු කුමක්ද?

එය පුදුම
පළතුරු ගසක්
එයට එච්චර
ගල්වලින් ගසද්දීත්
අපට
ගෙඩි ලබා දෙනවා....

ලාබයි
කඳුළු පැණි...

කථා කරන පින්තූර

දුක ගොතා
විකුණන
පුතා...

ජයාරූප අන්තර්ජාලයෙන්

වතුරට වඩා
බරින් වැඩි
ලේ...

දුක
දැනෙන
දුක...

සිනහව...

විහඟුන් ගී ගයන්නේ
දෙසවන් බිහිරි කිරීමට නොව
මිහිරි කිරීමටය...
කුසුම් කැන් පූදින්නේ
බාහිරයට හැඩ පෙන්වන්න නොව
බිඟු පොදියේ කුස පුරවන්නටය...
මිනිසුන් සිනාසියයුත්තේ
තව සිතක් කඳුලින් පුරවන්න නොව
සැම සිත් සනහාලීමටය...

S.H. හංසි
M.R.C.M
2020 A/L

> ආදරය
> ඇත්තේ කොහිද...
> එතැන
> ජීවිතය
> පවතී
>
> මහත්මා ගාන්ධි...

දුක නොකියන මැසිමක් ඇත...

ආකාසේ දිළිහි දිළිහි
ඇලුමිනියම් තසිමක් ඇත
ඒ තසිමේ එලිය බිබී
වැඩ කරනා මැසිමක් ඇත

රෑ තුන්යම පුංචි එකා
අඬන අඬන හැම වාරෙම
ලේ ධාතුව කිරි කරලා
බඩ පුරවන මැසිමක් ඇත

දාඩිය සිතියමින් සපිරි
කුණු නාවර කිළිටි වස්ත්‍ර
ඇන තියාන සෝදා දෙන
කරන්ට් නොයන මැසිමක් ඇත

හාල් සීනි පිටි පරිප්පු
කන් හැන්දෙන් කිරා බලා
පිච්චියකින් රෝල් කරන
කඩේ දුවන මැසිමක් ඇත

ඉරට කලින් ලිපට පිඹින
හඳට පසුව ඇඳට වැටෙන
කවදාවත් හොඳ නාහන
පඩි නොලබන මැසිමක් ඇත

Kalasi Ranshara Marambage
M.R.C.M
2020 A/L

> ජයග්‍රාහකයකු යනු
> කිසිදා අත් නොහරින
> සිහින දකින්නකු වේ...
>
> නෙල්සන් මැන්ඩෙලා

> හොඳ මිනිසුන්
> විනාශවන්නේ
> නරක මිනිසුන්
> හඳුනා ගැනීමට
> නොහැකි වීමෙනි...

> වලාකුළුවලින්
> මිදුණු සඳ
> බබළන්නේ යම් සේද...
> වැරැදිවලින්
> මිදුණු දිනෙක
> ඔබද ලෝකය
> බබලවන්නේය...

මිනිසුන්ගේ
හැඩ රුව නොව
හදවත දිනාගන්න...
මිනිසුන්ගේ
තර්කය නොව
හැඟීම් දිනාගන්න...
මිනිසුන්ගේ
නැතිබැරි කම නොව
මනුස්සකම අගයන්න...
මිනිසුන්ගේ
හොඳ නරක නොව
තමාගේ හොඳ නරක
තේරුම් ගන්න...

හැකිද ඔබට...?

හැකිද ඔබට
ඉලෙක්ට්‍රෝනයක් සේ පද්ධතියේ නිවැරදිව
ස්ථානගතව සිට අවශ්‍ය සැම විටම නිහතමානීව
ඉවත යන්නට.
හැකිද ඔබට
න්‍යෂ්ටියක් සේ එක පොදියට එකට බැඳී ශක්තිමත්
වන්නට, අනන්‍යතාවය රකින්නට.
හැකිද ඔබට,
නියුට්‍රෝනයක් සේ එකමුතුකමේ බැඳීම රකිමින්
විකර්ෂණ අවම කරන්නට.
හැකිද ඔබට,
උච්ච වායුවක් සේ කෙතරම් බාහිර බලපෑම්
පැමිණියද ස්ථායීව සිටින්නට.
හැකිද ඔබට,
අයනික ද්‍රාවණයක් සේ සැම දෙනටම හොඳින්
අනුරූප වන්නට.
ඝන අවස්ථාවේ ශක්තිමත් දැලිස සාදන්නාක් මෙන්
බාහිර තාපයන්ට එක්සත් බවේ බලය පෙන්වන්නට.
හැකිද ඔබට,
විවිධ වර්ග, ජාති, ආගම්, කුල භේද අතහැර
එක්සත් සමාජයක් ගොඩනගන්නට.
එදිනට ඔබට හැකිවේවි,
මුළු ලොවම එකම පරමාණුවක් කරන්නට,
මුළු මහත් ලෝකයම සුවපත් කරන්නට...

සකු
S.T.G.
2018 A/L



Sandun RANGANA

උත්සාහය අත් නොහරින තාක් කල් දිනන්න අවස්ථාව තියෙනවා

මගේ කථාව කොතැනින් පටන් ගන්නද කියලා මටම හිතාගන්න බැහැ. අපි හැමෝගෙම ජීවිතවල සුන්දරම කාලේ තමයි ළමා කාලය කියන්නේ. එතනින් මගේ කථාව පටන් ගත්තොත් මටත් සුන්දර ළමා කාලයක් තිබුණා. හැබැයි ඒක බොහොම දුෂ්කර, කටුක අවාසනාවන්ත සිදුවීම් ගණනාවකින්ම පිරුණු එකක්.

මගේ පවුලේ අම්මයි, තාත්තයි, අයියයි, මල්ලිලා දෙන්නයි, මමයි. ඒත් අද වෙද්දි මගේ තාත්තයි, මගේ අයියයි ජීවතුන් අතර නැහැ. මගේ තාත්තා නැති වෙද්දි මම 1 වසරේ. ඒ වෙනකොට අම්මට පොඩි මල්ලි හම්බවෙන්න ඉන්නවා. තමන්ගේ ස්වාමි පුරුෂයා නැති වුණාම දරුවොත් අරගෙන අනුන්ට අතපාන්න පාරට බහින සමහර අම්මලා ඉන්න අද වගේ සමාජයක මගේ අම්මා එහෙම කළේ නැහැ. ගෙවල් ඉස්සරහ පාරේ අයිනක පොල් තියාගෙන ඒවා විකුණලා ගොඩක් දුක් කරදර, බාධක මැද්දේ අම්මා අපව ලොකු මහත් කළා විතරක් නෙවෙයි අපට හොඳට ඉගැන්නුවා.

මේ දේ මගේ කථාවේ මුලින්ම කියන්න හිතුවේ අම්මගේ ඒ අපරිමිත කැපකිරීම්, ඒ අප්‍රතිහත ධෛර්යය නොවුණනම් මගේ වගේම මගේ සහෝදරයන්ගෙත් ජීවිත පාරේ කොහේ හරි අඟුපිලක අඳුරු, අවාසනාවන්ත ජීවිත වෙනවා කියලා මම හොඳටම දන්න නිසා.

මගේ කථාවට ආයේ ආවොත් මම ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ ගමේ පාසලේ. ඒ ගින්තොට මහා විද්‍යාලය. එහෙම ගමේ පාසලෙන් අධ්‍යාපනය ආරම්භ කරපු මම 5 වසරේ ශිෂ්‍යත්වයෙන් පාස් වෙලා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුලත් වෙන්න වාසනාවන්ත වෙනවා. ඒ දේ ජීවිතේ මම ලබපු ලොකුම වාසනාවක්. රිච්මන්ඩ්

මගේ උත්සාහය කවදාවත් අත් හරින්නේ නැහැ. මාව මේ තත්ත්වෙට ගේන්න අම්මා හෙළපු දුක් කඳුළුවලට, ඒ කරපු අපරිමිත කැප කිරීමට කෘතගුණ සලකන්න ඕන කියන හැඟීම මගේ හිතේ හැමදාම තියෙනවා. ඒ දේ මම කොහොමහරි කරනවා. ශාරීරික ආබාධවලින් පෙළෙන, ජීවිතේ දිනන්න වෙර දරන අය වෙනුවෙන් දැනෙන දෙයක් කරන්න මගේ හිතේ ලොකු හීනයක් තියෙනවා. මේ හීනවලට මම ටිකෙන් ටික කොහොමහරි යනවා.

විද්‍යාලය මගේ ජීවිතයට ලොකු හයියක් වුණු, මගේ ජීවිතේ වෙනස් කරපු ප්‍රධාන සන්ධිස්ථානයක්.

මම අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යන අතරේ තමයි මගේ ජීවිතේ අවාසනාවන්තම දවස උදා වෙන්නේ. ඒ මම 10 වසරේදී. මම හැමදාම ඉස්කෝලේ ගියේ School train එකේ. එදා මම ඉස්කෝලේ යන්න train එකට නගින්න යද්දී කකුල ලිස්සලා වැටිලා train එකට අහුවෙලා මට මගේ කකුල් දෙක නැති වෙනවා.

එදා මාව කරාපිටිය Hospital එකට ඇඩ්මිට් කරලා ඔපරේෂන් එකෙන් පස්සේ මට මුලින්ම සිහි එද්දි මගේ කකුල් දෙක නෑ කියලා දැනග නිද්දි මගේ මුළු ජීවිතේම නැති වුණා කියලා මට හිතුණා. ඒ විදියට විඳවන්න ඇයි ජීවිතේ ඉතුරු වුණේ කියලා එදා මට හිතුණා. මම Hospital එකේ මාස හතරකට ආසන්න කාලයක් ඉන්නවා.

ඔය ඉන්න කාලේ මට කියවන්න හම්බවෙනවා The Story Of a Real Man කියන පොතේ සිංහල පරිවර්තනය වන සැබෑ මිනිසකුගේ කථාවක් කියන පොත. මේ පොතේ කියවෙන්නේ දෙවන ලෝක යුද්ධ කාලේ ජර්මානුවන්ට එරෙහි සටනේදී තමන්ගේ යානයට සතුරු ප්‍රහාරයක් එල්ල වෙලා කඩන් වැටිලා ඔහුගේ දෙපා අහිමි වෙලා තියෙද්දිත් ආයෙමත් තමන්ගේ උත්සාහයෙන් ගුවන් යානා පදවලා ගුවන් සටන්වලට සහභාගී වෙච්ච සෝවියට් ප්‍රහාරක ගුවන් නියමුවෙකුගේ ඇත්ත කථාවක්.

මේ පොත මම මගේ ජීවිතේ ගැන කලින් හිතාගෙන හිටිය විදිය වෙනස් කරලා ධනාත්මක විදියට හිතන්න ආරම්භයක් හදලා දෙනවා. ඒකත් එක්කම මම මේ වගේ ජීවිතේ අභියෝගවලට අභියෝග කරලා, ජීවිතේ දිනූ මිනිස්සු ගැන හොයන්න ගන්නවා. ඒ අතරේ මට හම්බවෙන ප්‍රධාන චරිතයක් තමයි Nick Vujicic කියන්නේ. උපතින්ම තමන්ගේ අත් පා නැතිව ඉපදෙන, Nick අද වෙනකොට ඔහුගේ උත්සාහයෙන් ලෝකයම ජය අරගෙන අනිත් අයට ජීවිතය උගන්වන ලෝකේ හොඳම Motivational Speaker කෙනෙක්. මගේ හිතේ අදටත් මතක තියන ඔහුගේ ප්‍රසිද්ධ කියමනක් තියෙනවා.

As long as I try" there's always a chance of getting up' It's not the end until you give up'

ඉතින් ඔක්කොම එක්ක මම තේරුම් ගත්තා මට නැති වුණේ කකුල් දෙක විතරයි. ඊට වඩා ගොඩක් දේවල් නැති වුණ මිනිස්සුත් ජීවිතේ අභියෝගවලට මුහුණ දීලා ජීවිතේ දිනලා තියෙනවා කියන එක. මමත් කවදා හරි දිනනවාමයි කියලා හිතේ දැඩි අධිෂ්ඨානයක් ඇති කර ගන්නවා මම.

ඒ අරමුණත් එක්ක පටන් ගන්න මගේ අලුත් ජීවිතේ ඉස්සරහට යන්න මගේ අම්මා, අයියා, මල්ලිලා දෙන්නා ලොකු ශක්තියක් වෙනවා මට. ඒ වගේම තමයි මගේ පාසල. එක පුංචි කාමරේක ජීවත්වුණු අපි පස් දෙනාට අපේම කියලා ගෙයක් හදලා දෙන්න මගේ පාසල කටයුතු කරනවා.

මේ දේවල් එක්ක හිතේ ලොකු අධිෂ්ඨානයකින් ආයෙමත් අධ්‍යාපන කටයුතු පටන් ගන්න මම එතැන ඉඳලා ඉස්කෝලේ ගියේ Hostel එකේ නැවතිලා ඉඳන්. රෝද පුටුවේ තමයි මම ඉස්කෝලේ ගියේ. මගේ අයියා Hostel එකේ මාත් එක්ක නැවතිලා ඉඳන් මට ශක්තියක් වුණා. ඒ වගේම පාසලේ ගුරුවරු, මගේ යාළුවො, සහෝදර ශිෂ්‍යයෝ ගොඩක් උදව් කළා මට.

මේ හැමදේම එක්ක මම සාමාන්‍ය පෙළ විභාගයට මුහුණදීලා A 9ක් එක්ක Exam pass වුණා. එදා පළමුවැනි වරට අම්මට Result කියද්දි අම්මට දැනුණ සතුට, මගේ ජීවිතේ ඉස්සරහට යන්න මට තවත් ශක්තියක් වුණා.

පුංචි කාලේ ඉඳලම ගණිතය විෂයයට ආසාවක් තුබුණා. මම එතනින් පස්සේ තීරණය කරනවා ගණිත අංශයෙන් උසස් පෙළ හදාරන්න ඕන කියලා. ඒකත් එක්කම මට ආපු ලොකු අභියෝගයක් වුණේ කොහොමද මම A/L කරන්නේ? මම කොහොමද Class වලට යන්නේ කියන එක? ඒ වෙනකොට මගේ නැති වුණ කකුල් දෙක වෙනුවට කෘතිම පාද දෙකක් දාලා නැගිටලා ටික ටික ඇවිදින්න පුළුවන්කම තිබුණා. ගොඩක් ආර්ථික ප්‍රශ්න මැද්දේ වුණත් හිතේ හයිය නිසාම A/L ගමන පටන්ගත්ත මම Class යන්නත් පටන් ගත්තා.

ඒ අතරේ මට හමුවෙන විශේෂ චරිතයක් තමයි ජනක සර් කියන්නේ. සර් විෂයය කරුණුවලට අමතරව හැමදාම අපිව දිරිමත් කරන්න කියන දේවල් මගේ හිතට ගොඩාක් දැනුණා. සර් මට පෞද්ගලිකව පවා කථා කරලා මාව දිරි ගැන්නුවා. සර්ගේ ඒ වචන හිතට ලොකු හයියක් වුණා. මම සර්ගේ Class ගියේ ගාල්ලේ තිග්මා එකේ.

සර්ගේ Class එකට යන්න පඩිපෙල 30ක් 40ක් නැගලා උඩට යන්න තිබුණා. එහෙම ගිහිල්ලා කකුල් දෙක දාගෙන එක දිගට පැය ගාණක් ඉන්න අමාරු නිසා ගොඩක් දවස්වල මම Class එකේදි කකුල් දෙක ගලවගන්නවා. එහෙම කරලත් ආයේ Class ඇරුණම පඩිපෙල ඔක්කොම බැහැලා ආයේ ගෙදර යද්දි සමහර දවස්වල කකුල් තුවාල වෙලා. එහෙම තුවාල වෙලා තියෙද්දි ආයේ කකුල් දැම්මොත් තුවාල වැඩි වෙන හින්දා ඉස්කෝලේ යන්න, Class යන්න තුවාල ඉක්මනට හොඳ කර ගන්න තුවාල වලට බෙහෙත් දාන්න ඕනේ ඒවා ගෙනල්ලා මමම බෙහෙත් දාගන්නවා. මේ විදියට ඒ අවුරුදු දෙක පුරා හොඳ කට්ටක් කෑවා.

ඒ වෙනකොට මගේ අරමුණක් තිබුණා IT Field එකෙන් ඉස්සරහට ගිහින් මගේ අනාගතය හදාගන්න. ඒ වෙනුවෙන් Computer Science Course එකට ඇතුල් වෙන්න Target කරන් Exam කරත් මගේ පළවැනි පාර Result වුනේ B,C,S මගේ අරමුණට යන්න ඒ Result එක කොහෙත්ම ප්‍රමාණවත් නැහැ කියලා තේරුම් ගත්ත මම දෙවැනි පාරටත් A/L Exam කරන්න තීරණය කළේ අවුරුදු 2ක් පුරා විඳපු ඒ වේදනාව තව අවුරුද්දක් ඒ විදියටම විඳින්න වෙනවා කියලා හොඳටම දැනගෙන, ඒ අභියෝගය බාර ගන්න ගමන්මයි. මම Class ගිහින් මහන්සි වෙලා දෙවැනි පාරත් A/L ලිව්වා. දෙවැනි පාර මගේ ප්‍රතිඵලය B,C,C ඒ පාරත් මට මගේ අරමුණට යන්න ඒ ප්‍රතිඵලය ප්‍රමාණවත් වුණේ නැහැ.

It's not the end until you give up

මම කලින් කිව්වා වගේ ඔය දේ මගේ හිතේ තදින්ම තිබුණා. ඒ වගේම තමයි Class එකේදි ජනක සර් හැම වේලේම වගේ කිව්ව කියමනක් මගේ හිතේ අදටත් තදින්ම කාවැදිලා තියෙනවා.

ඉක්මනින් හෝ පමා වී හෝ දිනන මිනිසා වන්නේ තමාට හැකි යැයි සිතන මිනිසාය.

ජීවිතේ වැටෙන හැම මොහොතකදීම මේ දේවල් මට ආයේ ආයේ මතක් කරලා දුන්නා. මගේ උත්සාහය අත් නොහරින තාක්, මට පුළුවන් කියලා හිතන තාක් කල් මම පරාද නැහැ කියන එක. මගේ උත්සාහය අත් හැරියේ නෑ. මට පුළුවන් කියන දේ මම විශ්වාස කළා. ඒ විශ්වාසයත් එක්ක මම 3 වැනි පාරටත් Exam කරන්න තීරණය කළා.

කෘතිම පාද දාලා Class යද්දි මට මතකයි ඒ දවස්වල දිගින් දිගටම දණහිසට පහළින් ඉවත් කරලා තිබ්බ මගේ වම් කකුළ තුවාල වෙන්න පටන් ගත්තා. Doctors ලට පෙන්නුවම කිව්වේ දිගින් දිගටම තුවාල වුණොත් ඒ කකුලත් දණහිසට උඩින් කපල අයින් කරන්න වෙයි කියලා. ඒත් මම ඒකට කොහොමවත් කැමැති වුණේ නෑ. එහෙම අවධානමකුත් තියාගෙන තුවාල වෙද්දි මමම බෙහෙත් කරගෙන ඒවා හොඳ කරගෙන දිගටම Class ගියා. මේ හැම දේකටම මගේ පිටිපස්සෙන් ලොකු ශක්තියක් වෙලා මගේ අම්මා වගේම මගේ අයියා, මල්ලිලා දෙන්නත් හිටියා.

ලොකු දුකක්, වේදනාවක් විඳලා ගොඩක් මහන්සි වෙලා තුන්වැනි වරටත් Exam ලිව්වත් මගේ හීනෙට යන්න ඒ පාර Result එකත් ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ සැරේ මගේ Result එක වුණේ B,B,C. Computer Science Course එකට යන්න මගේ ආසාව තිබුණත් මගේ Result එකට අනුව මාව තේරුණේ රුහුණේ Physical. රුහුණේ Physical Course එකේදී CS Subject එකක්

සිතට හොරා

> හෘද සාක්ෂියට අනුව, හරිදේ හරිවෙලාවට කරන්න පුරුදු වෙන්න. එතකොට කවදාවත් අපිට තුත්තිරි ගස්වල පිහිට පතන්න ඕන වෙන එකක් නැහැ.

මං දන්නවා මාතෘකාව දැකපු ගමන් ඔයාලට මතක් වුණේ මොකක්ද කියලා. ඒක ටිකකට අමතක කරලා අපි හිතලා බලමු, අපිට හිතට හොරා වැඩ කරන්න පුළුවන්ද කියලා. පුළුවන් නම් ඒ මොනවද කියලා. මට නම් හිතෙන්නේ උගුරට හොරා බෙහෙත් බොන්න පුළුවන් වුණොත්, අන්න එදාට හිතට හොරා වැඩ කරන්නත් අපිට පුළුවන් වේවි. ඒත් ඉතින් කරුමේ කියන්නේ ඒ දෙකම කරන්න අපිට බැරි එක.

එහෙම වුණාට මොකද හිතට හොරා කිය කියා අපි කොයි තරම් නම් දේ කරනවද? ඒත් පොඩ්ඩක් හිතලා බැලුවොත් අපි හිතට හොරා කියලා කරන දේ තමයි වැඩිපුරම හිතල කරන්නේ. පැය ගණන්, දවස් ගණන් ලෝකෙට හොරා කල්පනා කරලා, සැලසුම් හදලා, හොර රහසේම ඒවා ක්‍රියාත්මක කරලා, අපිම ඒකට නමක් දා ගන්නවා. හිතට හොරා කියලා. ඇත්තටම ඒක සාධාරණද?

අපේ හිත මෙල්ල කරගන්න බැරි කමට අපි කරන ගොඩක් වැරැදි වලට අපි අන්තිමට ඔය හිතට හොරා කියන ලේබල් එක ගහලා තියෙනවා. ඒත් මටනම් හිතෙන්නේ කොච්චර සැලසුම් හැදුවත්, කොච්චර ඒ ගැන කල්පනා කළත් අපි ජීවිතේ විඳවනවනම් ඒ බොහොමයක් හිත් රිදවීම්වලට හේතුව ඔය කියන හිතට හොරා කළ දේමයි. මොකද අපි මේ හිතට හොරා කියලා කියන්නේ ඇත්තටම අපේ හිත දැනුවත් වීමක් නැතුව කරපු දෙයක් නෙවෙයි. ඒ හිත වැරැදි කියලා අපිට කියද්දි අපේ හිතට විරුද්ධ වෙලා, ඒ දේ කළා කියලා අපේ හිතටවත් නොදන්වන්න උත්සාහ කරලා අපි කරන දේ.

වැඩිපුර නිදාගත්තම, වැඩිපුර රස්තියාදු ගැහුවම, TV එක ඉස්සරහ පැය ගණන් ගත කළාම අපේ ඉගෙනීමේ වැඩ අතපසු වෙනවා කියලා අපි දන්නවා. ඒ අපේ හිත ඒවා වැරැදියි කියලා අපිට කියාදෙන නිසා. ඒත් අපේ හිත කියන දේ අමතක කරලා හිතට හොරා අපි අතර ඉන්න බොහෝ දෙනෙක් ඔය හැම දෙයක්ම කරනවා. මවුපියන්ට හොරා ප්‍රේම සම්බන්ධතා පටන් ගත්ත බොහෝ දෙනෙකු ඒ නිශ්ඵල දෙයින් විඳවන්නේ ඒ දේ වැරැදියි කියලා දැන දැනත් ඒ වැරැද්ද කරපු නිසා.

කොහොම වුණත් මතක තියාගන්න, අපි හිතට හොරා කියලා යම් වැරැද්දක් කරනවා නම්, අනිවාර්යයෙන්ම අපි ඒ දේ කරන්නේ ඒ දේ වැරැදියි කියලා දැනගෙන. ඒ දේ වැරැද්ද කියන වචනයෙන් අපි ලේබල් නොකළත්, ඒ දෙයින් ලැබෙන ප්‍රතිඵලවලින් අපි විඳවන්නේ ඒ නිසයි. ඒ දේ ගැන පසුතැවෙන්නේ ඒ නිසයි.

ඒ නිසා අපි හැම වෙලාවකම උත්සාහ කරන්න ඕන හෘද සාක්ෂියට අනුව වැඩ කරන්න. එතකොට අපිට මෙච්චර දුක් විඳින්න ඕන වෙන එකක් නැහැ. ලෝකෙට නොපෙනෙන්න අඬන්න ඕන වෙන එකකුත් නැහැ

තවත් දෙයක් ගිලෙන්න යන මිනිහා තුත්තිරි ගහෙත් එල්ලෙනවා කියලා කථාවක් තියෙනවා තමයි. ඒත් ගිලෙන්න යන මිනිහා දැනගන්න ඕනේ තුත්තිරි ගහේ එල්ලුනා කියලා තමන්ට බේරෙන්න බැරි බව. අන්න ඒක තේරුම් ගත්තොත් ඒ මනුස්සයට පුළුවන් වේවි වෙන සාර්ථක ක්‍රමයකින්, නොමැරී බේරෙන්න.

මොකද අසාර්ථක, සිත් රවටන, බොළඳ විකල්පවලින් අපි ජීවිතේ සතුට සෙව්වොත් අපිට වෙන්නේ හැමදාමත් විඳවන්න විතරයි.

හෘද සාක්ෂියට අනුව, හරිදේ හරිවෙලාවට කරන්න පුරුදු වෙන්න. එතකොට කවදාවත් අපිට තුත්තිරි ගස්වල පිහිට පතන්න ඕන වෙන එකක් නැහැ.

යාළුවා

තිග්මා-ගාල්ල 2017 A/L

සිහිනයට පාර කියන්න

අනාගත සිහිනය කිව්වම කාට කාටත් එක් එක් විදියේ අපූරු ,සුන්දර ලෝක මැවෙනවා. මේ ලෝකේ බහුතරයක් මිනිස්සු අනාගත සිහින ගැන තලු මර මර කථා කරනවා. ඒත් ඒ තරම් පිරිසක් කවදාවත් ගෙන්දගම් පොළොවේ පය ගහලා ඒ සිහින සැබෑ කරගන්න විදිය ගැන කථා කරන්නේ නැහැ.

මහත්මා ගාන්ධි, නෙල්සන් මැන්ඩෙලා ගැන දන්නවද? අහලා තියෙනවද? මෙහෙම කිව්වම ඔයා හිතයි මොකටද මේ අය ගැන දන්නවද කියලා අහන්නේ. මේ වැදගත් නායකයෝ තමන් දැකපු හීන මේ ලෝකය මත මවන්න අනන්ත කැප කිරීම් කළා. ඒ වගේම කවදාවත් අධිෂ්ඨානය පළුදු කරගත්තේ නැහැ. ඒ නිසයි මම මේ අය ගැන දන්නවද කියලා ඇහුවේ. සාමාන්‍ය මනුස්සයෙක් විදිහට ඉපදුණාට කමක් නැහැ. හැබැයි සාමාන්‍ය මනුස්සයෙක් විදියටම මියැදෙන්න එපා.

ලෝකයේ සිහින සැබෑ කරගත්තු, අධිෂ්ඨානය, උත්සාහය පිරුණු හදවත් තියෙන උත්තුංග මිනිස්සු දිහා බැලුවම අපි මොනවද අපේ හීන වෙනුවෙන් කරලා තියෙන්නේ කියලා හිතෙනවා. ඔයා ,මම, අපි කවුරුත් වගේ මේ තාක් දුරට කරලා තියෙන්නේ සැප පහසුකම් හොය හොයා , පරිවාර සම්පත් වැඩි දියුණු කරපු එක. දැන්වත් බොරු සෝබන වැඩ නවත්වලා වැඩ කරමු නේද?

අද කට්ට කාලා ඉගෙන ගත්තොත් හෙට සල්ලි තියෙන ලොකු ලොක්කො පවා ඔයාට සර් , මැඩම් කියලා කථා කරයි. දෙයක් කියන්නම්, සිහින සැබෑ කරගන්න පවුලේ තත්ත්වේ, පාසලේ තත්ත්වේ, දුප්පත් පොහොසත් බව, ෆෝන් එක වැදගත් වෙන්නේ නැහැ. පරිවාර සම්පත් වැදගත් නම් කවදාවත් උසස් යැයි සම්මත පාසල් වලින් කොන්දොස්තරලවත්, කුඩා යැයි සම්මත පාසල් වලින් දොස්තරලවත් බිහිවෙන්න විදිහක් නැහැ. සිහින සැබෑ කරගන්න වැදගත් වෙන්නේ උත්සාහය, අධිෂ්ඨානය පිරුණු හදවත විතරමයි.

හිතලා බලන්න, මේ කියන කථා ඇත්තද කියලා. ඔයා ඔයාම වෙන්න උත්සාහ කරන්න. ඒ වෙලාවට මිනිස් අහස ගුගුරලා අපහාස වර්ෂා වැටුණත් ඔයා කරන්නේ හරි දේ නම් ඔයාට වරදින්නේම නැහැ.

සදා ජය.

K.K.D

'අනවශ්‍ය දේවල් අනවශ්‍ය කාලයේ නොකර Relax එකේ ඉගෙන ගන්න.....'

ලං කර ගැනීම පීඩාකාරී නම් දුරින් හිඳ විඳ ගමු

පසු ගිය දැක්ම කලාපයක තිබූ "ඔළුවේ තිබුණු හෙල්මට් එක දැන් අතේ " කියා කෙල්ලෙක් නිසා O/L ඇන ගත්ත කොල්ලෙක් ලියූ Article එකක් අහම්බෙන් දැක මම මේ සටහන තබමි.

මුලින්ම මට A 3 යි. ඒ O/L වලටය. A/L පටන්ගත්ත ගමන් මාතර නගරයේ මා නොගිය පන්තියක් නොමැත. එලෙසින් මම A/L ජීවිතයේ පටන් ගැන්මම කෙලගතිමි. ටියුෂන් පන්තිවලදී හුරතල් බසින් Subject එක දුන් නිසා A/L හි බරක් මට නොදැණුනි.

කාලය ගත වුණි. Revision කාලය පටන් ගැණුනි. කරුමයකට මෙන් මල්සර හීයක් කොහෙන්දෝ පැමිණ මගේ ළය පසාරු කරගෙන ගියේය. Line දැමීමේ මෙහෙයුමට මම බොක්කෙන්ම බැස්සෙමි. ඒ වන විට මම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම රස්තියාදුකාරයෙකි. අපතයෙකි. Line දැමීම ආරම්භ කර සති දෙකකින් කැමැත්ත විමසුවෙමි.

ඔලුව කොහේ හරි වැදිලද? තමුසේ වගේ අපතයන්ට මං කැමැති නෑ. CLZ වල පිටිපස්සේ පේලියට වෙලා පිස්සු නටනවා. අඩුම තරමේ විභාගේ pass වෙන්න බලන්න. මට වද දෙන්න එපා.

මට ළඟ තිබූ පොල්ලකින් ගැසුවා නම් මීට වඩා හොඳයි. ඒකි නිකං Engi ගිහින් Out වෙලා වගේ Talk එකක් තමයි දුන්නේ. ඇත්තටම මට යකා නැග්ගා.

එදාම මම මගේ බෙකම් Hair style එකට සමු දුන්නෙමි. අත්වල තිබූ Band වලට, කරේ තිබූ මාලයට Bye කිව්වෙමි. මට හිතුනා ඕකිට මං පෙන්නනවා මං කවුද කියා.

මීළඟ Target එක වූයේ A/L කරන්න ඉස්සෙල්ලා එක පාරක් හෝ ජනක සර්ගෙන් Prize එකක් ගැනීමය. වෙනදා රෑ 10ට නිදා ගන්නා මා එදා පාන්දර 1 පමණ වෙනකම් පාඩම් කළා. අපේ අම්මා එදා රෑ 12ට අහම්බෙන් නැගිට මා පාඩම් කරනවා දුටු විට හොල්මනක් දුටුවා සේ විය. ඇය මට තේ එකක් සාදා ළඟට ගෙනත් දෙන විට ඇගේ ඇස් වල තිබූ කඳුළු මට තාම මතකය.

සෑම CLZ එකකම සිත් ගත් ඇය මාගේ දර්ශන පථයට හසු වන සේ මම අසුන් ගතිමි. clz වලදී නිදි දෙව්දුව මා වෙත පැමිණෙන විට ඇගේ රුව දෙස නෙත් යොමු කර නිදි දෙව්දුව පලවා හැරියෙමි .

ජනවාරි මාසයේ ජනක සර්ගේ පන්තියේදී ප්‍රථම Prize එක ගත්තෙමි. දැනුණු සතුට නිම්හිම් නැත. ඉන්පසු එක දිගටම නොවුණත් වරින්වර Prize ගත්තෙමි. ඒත් ඇය මාව මායිම් කළේ නැත. මාගේද දැන් ගෑස්ය.

අප්‍රේල් 6 වැනිදා ඈ ප්‍රේමය ප්‍රකාශ කළාය. ඒ මට නොවේ, වෙන අයෙකුටය. ඌට අපි ගහමු. ඔය Affair එක කඩමු. උඹ ඉඳපන් මං ඕකිට හොඳ පාඩමක් උගන්වන්නම්. මහදැනමුත්තාගේ ගෝලයෝ රොත්තගෙන් අදහස් ලැබුණි. මට නැවත හැරීමට නොහැක. පරණ අපතයාද වීමට නොහැක.

ලතවීමට බෙහෙත තවත් කෙල්ලෙක්මය. මා තව කෙල්ලෝ තුන් දෙනෙකුට කොක්ක දැමීම ඇරඹුවෙමි. නමුත් අදද ඔවුන් තුන්දෙනා ඒ බව දනී දැයි මම නොදනිමි. ඒ කාලයේ කැමැතිම සින්දුව 'සිතින් විතරක් පෙම් කරන්නම් දුරින් හිඳ ඔබ දෙස බලන්නම්'ය.

කාලය ගත විය. මම උපරිමයෙන් Exam එක ලිව්වෙමි. Results ආවේය. මට A 3 කි. මම District මුල් රෑන්ක් 50 තුළ සිටියෙමි. හරිම සතුටුය. ජනක සර්ගේ Revision එක දවසේ Results කියන්නට ආවෙමි. මම ඈව Engi Set එකේ සෙව්වෙමි. ඇය නැත. Stage එකට නැග්ගුව පසු මා ඈව clz එකේ වාඩිවී සිටිනවා දුටිමි.

දැන් තත්ත්වය නම් Campus එකේ මා ඇගේ සීන්නෙකි. මෙවන් කථා විරලය. බොහෝ අය කෙල්ලන් පසු පස වැටී නන්නත්තාර වෙයි. Affair තියෙන මල්ලිලා නංගිලාට මං උපදෙස් කීපයක් දෙන්නම්.

1. Affair එක උඹලට සාමාන්‍යකරණය වී නැත්නම් වහාම නවත්වන්න.

2. A/L කාලයේ පැපොල් මල් Campus එකෙන් එළියට එන විට ඇපල් මල් වෙයි. එමනිසා උඹලගේ ඔය කොකු Miss Sri Lanka යැයි නොසිතන්න.

3. අනවශ්‍ය දේවල් අනවශ්‍ය කාලයේ නොකර clz වල Relax එකේ ඉගෙන ගනිං.

ඉතිං මං කැපෙන්නං, උඹලට ජය.

ඉස්සර කෙල්ලන්ගේ පස්සෙන් ගොස්
දැන් කෙල්ලන් පස්සෙන් එන අයියා කෙනෙක්

11 පිටුවෙන් / මා ආ මාවත...

විදියට කරන්න පුළුවන්කමක් තිබුණත් CS Special එකක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ අවස්ථාව තිබුණෙ Colombo Campus එකේ Physical වලට. මම Appeal කරත් අවස්ථාව ලැබුණේ නැහැ.

ජීවිතේ මේ විදියට වැටෙන්න වැටෙන්න මම හිතෙන් තවත් ශක්තිමත් වුණා. අවුරුදු 4ක් පුරා A/L ජීවිතේ මට මුහුණ දෙන්න වුණු අභියෝග එක්ක ජීවිතේ එන ඕනම අභියෝගයකට අභියෝග කරලා, වැටෙන්නේ නැතුව ඒවාට සාර්ථකව මුහුණ දෙන්න ලොකු පන්නරයක් ලැබුණා. අන්තිමේ මම තීරණය කළා Select වුණු Course එකෙන් මගේ අරමුණටම Direct යන්න බැරි වුණත් Degree එක මට පුළුවන් උපරිමයෙන් කරලා ඒකෙන් ගන්න පුළුවන් උපරිම දේ අරගෙන කොහොම හරි මම මගේ අරමුණට යනවා කියලා.

A/L ලියලා ඉවර කරලා Campus පටන් ගන්න කාලේ අතරතුර ගෙදරට වෙලා ඉන්නේ නැතුව මගේ හීනෙට ඉලක්ක කරගෙන Computer Course එකකුත් කළා. ඒ හරහාත් මම ලොකු දැනුමකින් පෝෂණය වුණා. මේ හැම දේටම වියදම් කළේ මගේ අම්මා. කොච්චර අග හිඟකම් තිබුණත් මට වගේම අයියාට, මල්ලිලා දෙන්නාට, අපේ ඉගෙනගන්න දේවලට අම්මා අනේක විද දුක් විඳලා හම්බකරන අන්තිම සොච්චමත් වියදම් කළා.

ඔය කාලේ තමයි අම්මා මත පැටවිලා තිබුණ පවුලේ බර කරට අරගෙන අයියා රස්සාවකට යන්නේ. අයියාට වනජීවි එකේ වනසත්ත්ව නියාමකවරයෙක් විදියට පත්වීම ලැබෙන්නේ. මම, අම්මා අපි ඔක්කොම ඒකෙන් ගොඩක් සතුටු වෙනවා. ඒත් ඒ සතුටත් වැඩි කාලයක් තියෙන්නේ නැහැ. සේවා මෙහෙයුමක් අතරෙදි මගේ අයියා වන අලි ප්‍රහාරයකට ලක්වෙලා අපෙන් සදහටම වෙන්ව යනවා. මට අවශ්‍යම කාලේ මගේ ළඟින් හිටිය අයියත් මට නැතිවෙනවා.

මේ විදියට ජීවිතේ ගොඩක් දේවල් මගෙන් උදුර ගන්නවා. මුලින්ම මගේ තාත්තා, ඊට පස්සෙ මගේ කකුල් දෙක, ඊටත් පස්සේ මගේ අයියා. තමන් ආස කරන, ආදරේ කරන පොඩි දේ නැති වුණාම, ජීවිතේට ප්‍රශ්න ආවම ඒවාට මුහුණ දෙන්න බැරුව තමන්ගේ ජීවිතේ නැති කරගන්න, එහෙම හිතන සමහරු ඉන්න මේ ලෝකේ මගේ අම්මා මේ හැමදේම විඳ දරාගෙන ජීවිතේ ඉස්සරහට යනවා. අම්මගේ තරම් ධෛර්යයක් මගේ හිතේ නැති වුණාට ඒ දිහා බලලා ජීවිතේ එන ප්‍රශ්නවලට, අභියෝවලට වැටෙන්නේ නැතුව මුහුණ දෙන්නේ කොහොමද කියලා ලොකු පාඩමක් මම ඉගෙන ගත්තා.

මේ හැම දේම මැද්දේ ජීවිතේ ඊළඟ දැවැන්තම අභියෝගයට මම මුහුණ දෙනවා. ඒ තමයි කැම්පස් ජීවිතේ. කැම්පස් ජීවිතේ ගැන කිව්වොත් මම හිටපු තත්ත්වෙත් එක්ක මට අභියෝග රැසකට මුහුණ දෙන්න සිදුවෙච්ච, සොඳුරු වගේම බොහොම කටුක අත්දැකීම් ගණනාවකින් පිරිච්ච, සහෝදරත්වය, බැඳීම් මේ හැමදේම එකතු වුණු මගේ ජීවිතේ තවත් එක සොඳුරු සන්ධිස්ථානයක්. ඒ අවුරුදු 3 ඇතුළේ මගේ ජීවිතේට ආපු බාධක, කම්කටොලු හැම එකකදීම ඒවාට සාර්ථකව මුහුණ දෙන්න මට ධෛර්යය තිබුණා. ඒ හැම දේකදීම මගේ යාළුවෝ, සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වගේම ආචාර්ය මණ්ඩලය, මේ හැමෝගෙන්ම මට ලොකු සහයෝගයක් ලැබුණා. කොහොමහරි අවුරුදු 3 අවසාන වෙද්දි දෙවන පෙළ ඉහළ සමාර්ථයක් එක්ක මගේ Degree එක සාර්ථකව ඉවර කරන්න පුළුවන් වුණා.

ගොඩක් ආසාවෙන් බලන් හිටි මගේ ජීවිතේ ලස්සනම දවස තමා Convocation එක දවස. මගේ අම්මාත් ඉස්සරහ තියාගෙන හැමෝගෙම අත්පොළසන් මැද්දේ Stage එකට නගිද්දි මට දැනුණු සතුට වචනවලින් කියලා ඉවර කරන්න බැහැ. ජීවිතේ ගොඩක් දේවල් මට නැති වෙද්දි, මම මේ තරම් දුරක් ආවා නේද කියලා දැනෙද්දි මා ගැන ලොකු ආඩම්බරයක් දැනුණා. Subject එකක් විදියට CS කරලා ඒ Subject එකේ හොඳම Result වෙනුවෙන් මට Gold medal එකකුත් ලැබුණා

පුංචි කාලේ තාත්තා නැති වුණ දවසේ ඉඳන් තාත්තා කෙනෙක්ගේ අඩුව නොදැනෙන්න අද ඉන්න තත්ත්වෙට මාව ගේන්න අම්මා විඳපු දුක් වේදනාවලට පුංචි හරි සාධාරණයක් කරලා අම්මගේ මූණට සතුටක් ගේන්න පුළුවන් වෙච්ච එක මට ඒ හැමදේටම වඩා වටිනවා.

Campus එකෙන් Out වෙලා මාසයක් යන්නත් කලින් මට Campus එකේ Demonstrator කෙනෙක් විධියට සම්බන්ධ වෙන්න වාසනාව ලැබුණා.Demonstrator කෙනෙක් විදියට ඉන්න ගමන් ඒකෙනුත් අත්දැකීම් එකතු කර ගන්න අතරේ Job වලටත් Apply කළා. IT Job ගොඩක් තිබුණේ කොළඹ අවට. මම ඉන්න තත්ත්වෙත් එක්ක කොළඹ ගිහින් ඔයාට තනියම manage කරගන්න බැරි වෙයි, ඔයාට අමාරු වෙයි ඔය විදියට ගොඩක් අය කියද්දිත් මම විශ්වාස කළා "නෑ මට ඒ දේත් කරන්න පුළුවන්" කියන එක.

ඉතින් ඒ විදියට මම Job ගණනාවකටම Apply කරලා අන්තිමේදී මගේ උත්සාහය සාර්ථක වෙනවා. අද වෙද්දී මම නුවර පෞද්ගලික ආයතනයක මෘදුකාංග ඉංජිනේරුවරයෙක් විදියට සේවය කරනවා. කාටවත් කරදරයක් වෙන් නැතුව මගේ ඔක්කොම වැඩ මම කරගන්න ගමන්ම හම්බ කරන දෙයින් ගෙදරටත් කොටසක් යවලා අද වෙනකොට ජීවිතේ සතුටින් ඉන්නවා.

මෙච්චර දුරක් ආවේ ජීවිතේ ගොඩක් අභියෝග, දුෂ්කරතාවලට මුහුණ දීලා ලොකු කැපකිරීමක් කරලා. මම දන්නවා මේ ආපු දුරටත් වඩා ජීවිතේ තව ලොකු දුරක් මට යන්න තියෙනවා. අදටත් මම අභියෝගවලට මුහුණ දෙනවා. ඉස්සරහටත් මට මීටත් වඩා අභියෝගවලට මුහුණ දෙන්න වෙනවා කියලත් හොඳටම දන්නවා. ඒ හැමදේටම වැටෙන්නේ නැතුව සාර්ථකව මුහුණ දෙන්න මට ශක්තිය තියෙනවා.

මගේ උත්සාහය කවදාවත් අත් හරින්නේ නැහැ. මාව මේ තත්ත්වෙට ගේන්න අම්මා හෙළපු දුක් කඳුළුවලට, ඒ කරපු අපරිමිත කැප කිරීමට කෘතගුණ සලකන්න ඕන කියන හැඟීම මගේ හිතේ හැමදාම තියෙනවා. ඒ දේ මම කොහොමහරි කරනවා. ශාරීරික ආබාධවලින් පෙළෙන, ජීවිතේ දිනන්න වෙර දරන අය වෙනුවෙන් දැනෙන දෙයක් කරන්න මගේ හිතේ ලොකු හීනයක් තියෙනවා. මේ හීනවලට මම ටිකෙන් ටික කොහොමහරි යනවා.

නංගියේ, මල්ලියේ මට ඔයාලට කියන්න තියෙන්නේ ඔයාලාගේ ජීවිතෙත් Target එකක් තියාගන්න. ඒ Target එකට යන ගමනේදී ඔයාලටත් ගොඩක් ප්‍රශ්න, අභියෝග ඒවි. තමන් ආස කරන දේවල්, ආදරේ කරන දේවල් තමන්ට නැති වේවි. ඒ කිසි දේකින් වැටෙන්නේ නැතිව ඒ දේම හයියක් කරගන්න තමන්ට ඉස්සරහට යන්න. එක පාරක් දෙපාරක් නෙවෙයි දහ දොළොස් වතාවක් වැටුණත් තමන්ගේ උත්සාහය අත හරින්න එපා. ඔව් මට පුළුවන් කියන දේ හැමදාම විශ්වාස කරන්න.

උත්සාහය අත්හැරියොත් එදාට ඔයා පරාදයි නංගියේ, මල්ලියේ. උත්සාහය අත් නොහරින තාක් කල් ඔයාට දිනන්න අවස්ථාව තියෙනවා. ඔයාලට හොඳට උගන්වන්න ඔයාලගේ අම්මලා, තාත්තලා කරන කැපකිරීම්වලට, ඒ විඳින දුකට වටිනාකමක් දෙන්න. ඒ වෙනුවෙන් සාධාරණයක් කරන්න. ඔයාලා හොඳ Result එකක් අරගෙන අම්මට, තාත්තට ඒක කියද්දී ඒ අය කොයිතරම් සතුටු වෙයිද කියන එක හැමවෙලේම හිතින් දකින්න. ඒ දේ ඇත්තටම අත් දකින්න වැඩ කරන්න.

ඔයාලාට ජය......

16 පිටුවෙන් / STORY OF DETERMINATION...

එහෙම ගියොත් ඔයාට විහිළු කරන, හිරිහැර කරන අය එදාට ඔයාට මහ ඉහළින් ගරු කරයි." මව නයිම් පුතුව දිරිමත් කළා.

එදා ඉඳන් නයිම් පාසල් යන්න බැහැ කියමින් අදි මදි කළේ නැහැ. ඒ අතරවාරයේ ඔහු තමන් දියුණු කරගත යුතු දක්ෂකම ගැන කල්පනා කළා.

උසින් අඩුවුවත් නයිම්ට තිබුණේ ඉතාමත් ශක්තිමත් ශරීරයක්. කුඩා කල සිටම ඔහුට බරැති කළු ගල් සහ ගස්වල තරමක් විශාල අතු ඉතා පහසුවෙන් එසවීමේ හැකියාව තිබුණා. මේ හැකියාව වයසින් වැඩිවීමත් සමගම තව තවත් වැඩිදියුණු වුණා.

"බර ඉසිලීමේ ක්‍රීඩකයෙක් වුණානම් මට ගොඩාක් දුර යන්න පුළුවන් වේවි." නයිම්ට එසේ සිතුණා. එතැන් පටන් ඔහු වෙහෙසුණේ වඩාත් දක්ෂ, බර ඉසිලීමේ ක්‍රීඩකයෙක් වීමේ බලාපොරොත්තුව ඉටුකර ගන්නයි.මේ අතර 1980 ගණන්වලදී බල්ගේරියානු රජය ඒ රටේ ජීවත්වෙන සියලුම සුළු ජාතීන් වෙත නියෝගයක් නිකුත් කළා. එයින් කියවුණේ සුළු ජාතීන් හැම දෙනාගේම නම් බල්ගේරියානු භාෂාවට ගැළපෙන අන්දමට වෙනස් කරගෙන භාවිත කළයුතු බවයි. ඒ අනුව නයිම් සුලෙයිමනොග්ලු නම වෙනුවට ඔහුට නාවුම් ශලමනොව් යන නම භාවිත කරන්නට සිදුවුණා.

නයිම් බල්ගේරියාව නියෝජනය කරමින් ඉදිරිපත් වුණු බර ඉසිලීමේ තරගාවලියේ 1985, 1986 වසරවල රන් පදක්කම් 2 ක්ද 1983 දී රිදී පදක්කමක්ද දිනාගත්තා.

1988 දී නයිම් තුර්කිය බලා ගියා. ඒ වසරේදීම සියෝල් හි පැවැත්වුණු ඔලිම්පික් තරගාවලියේදී බර ඉසිලීම වෙනුවෙන් රිදී පදක්කමක්ද 1992 දී බාසිලෝනා හිදී හා 1996 දී ඇට්ලන්ටා හිදී පැවැත්වුණු ඔලිම්පික් තරගාවලිවලදී රන් පදක්කම්ද දිනාගනිමින් තුර්කිය වෙත ඉමහත් ගෞරවයක් හිමිකර දුන්නා.

තවද තුර්කිය නියෝජනය කරමින් බර ඉසිලීමේ ඉසව්වෙන් ලෝක ශූරතා රන් පදක්කම් 5 ක්ද යුරෝපීය ශූරතා රන් පදක්කම් 2 ක් හා ලෝකඩ පදක්කම් 1 ක්ද දිනාගන්නට නයිම් සමත් වුණා. ඒ හැරුණුවිට රන් පදක්කම් 2 ක්ද රිදී පදක්කම් 1 ක්ද දිනාගන්න ඔහු සමත් වුණා.

බර ඉසිලීමේ ලෝක ශූරතා 16 ක් බිඳහෙළා ඇති නයිම්, සින්ක්ලෙයාර් ලකුණු සටහනේ අදත් ලෝකයේ හොඳම බර උසුලන්නායි.

"මගේ උස ගැන දුක් වෙමින් සිටියා නම් අදටත් කිසි කෙනෙක් මාව දන්නෙ නැහැ. මම ඉදිරියට යන්න මාවතක් තෝරාගත්තා. ඒ මාවත දිගේ ගිහින් අද මම ලෝකයේම කථාබහට ලක්වූ බර උසුලන්නෙක්. කියන්න බැරි තරම් බාධක මැදින් තමයි මම මේ ගමන ආවේ. ඒ ගමන දිහා ආපසු හැරිලා බලද්දී මට දැනෙන්නෙ මුලු ලෝකයම දිනාගත්තා වගේ සතුටක්." නයිම් පැවසුවා.

නයිම්ට ගරු කිරීමක් විදිහට පැරගුවේ රාජ්‍යය සමරු මුද්දරයක් නිකුත් කර තිබෙනවා.

මේ ලෝක ශූරයා 2017 නොවැම්බර් 18 වැනි දින තුර්කියේදී අභාවයට පත්වුණා. ඒ, සිරෝසීස් රෝගයට ගොදුරු වීමෙන්.

මොහොතක් සිතන්න. ඔබ සිත දැනුදු ප්‍රශ්න වැලක පැටලිලා තිබෙනවා නේද? ප්‍රශ්නවලින් පැන යන්න නොව ප්‍රශ්නවලට මුහුණ දී ඒවා ජයගෙන නොසැලී ඉදිරියට යන්නේ කෙසේද? මෙම ලිපිය කියවා අවසානයේ ඔබට ඒ ගැන අදහසක් ඒමට බොහෝ දුරට ඉඩ ඇත.

නොනැවතී ඉදිරියට

ආදරණීය සොයුර, සොයුරිය,

ඔබ තවමත් ඉගෙනීමට දස්කම් පාන්නේ නැත්නම්, ඔබව, නැතහොත් ඔබේ සිත ප්‍රශ්න වැලක පැටලී ඇති බවට නිසැකය. නොඅනුමානය. සාමාන්‍ය පෙළ දක්වා හොඳින් අධ්‍යාපනය ලද ඔබගේ උසස් පෙළ අධ්‍යාපනය කඩා වැටී ඇත්නම් එයට හේතුව වන්නේ බොහෝ දුරට ඔබත් උසස්පෙළ රැල්ලට හසුවී ඇති අයකු වීමයි. ඔබ එහිදී සිතන පතන අයුරු වෙනස් වෙයි. ඔබටම එහිදී තමන් උසස් පෙලට ආවේ කුමකටද යන්න අමතක වේ. ඔබ අධ්‍යාපනය පසෙක දමා වෙන වෙන නොයෙකුත් විච්චූරණ වලට සිතේ මුල් තැන දීමට පටන් ගනී. එනම් ඔබගේ අඳුරු අනාගතයට සුබ මොහොතින් මුල්ගල තබන්නේ මෙම අවස්ථාවේදී යැයි සිතිය හැක.

'ඔබ අධ්‍යාපනය පසෙක දමා වෙන වෙන නොයෙකුත් විච්චූරණ වලට සිතේ මුල් තැන දීමට පටන් ගනීනම් ඔබගේ අඳුරු අනාගතයට සුබ මොහොතින් මුල්ගල තබන්නේ මෙම අවස්ථාවේදී යැයි සිතිය හැක.'

'උසස් පෙළ රැල්ල' නම් තම සිත තමන්ට අහිමි කරන රාක්ෂයාගෙන් බේරීමට ක්‍රමයක් ඇත්තේම නැද්ද? යන්න මේ අවස්ථාවේ ඔබේ සිතට නැගෙනු ඇත. මා සිතන ආකාරයට මෙම ප්‍රශ්නයට ප්‍රධාන හේතුව ඔබගේ සිත දුර්වල වීමයි. ඒ නිසා ඔබ ඔබගේ සිත, ශක්තිමත් කරගත යුතුය. ඒ සඳහා ඔබට භාවනා කිරීම, ධර්ම දේශනා වලට සවන්දීම, සිත දිරිමත් කරන කළ්‍යාණ මිත්‍රයන් ඇසුර හා ඔබව යහ මඟට යැවිය හැකි උපදේශ ඇතුලත් දැන්වීම්, සඟරා ආදිය කියවීම සිදු කළ හැක.

මේ සඳහා හොඳම උදාහරණය ලෙස සංයුක්ත ගණිත ආචාර්ය ජනක අබේවර්ධන ගුරුපියාණන්ගෙන් ඔබට පිදෙන දැක්ම පෝස්ටරය හා දැක්ම සඟරාව ගත හැක. මෙය හරියාකාරව ක්‍රියාවට නැඟුවහොත් නොයෙකුත් නොයෙකුත් විකාරයන්ගෙන් පිරී තිබූ නුඹේ සිත ශක්තිමත් වනු නොඅනුමානය.

තවද සමහර විට ඔබට ඉගෙනීමට ආශාව, උනන්දුව ඇතත්, නැතහොත් නුඹ කෙතරම් පාඩම් කළත් ටියුෂන් Class එකේදී, පාසලේදී පවත්වන Test වලදී ඒවාට ලකුණු අඩු නම් එයටද ප්‍රධාන හේතුව ලෙස ගත හැක්කේ නුඹේ සිතයි. එනම් සිත ප්‍රශ්න වලින් පිරී යාමයි. තම සිතට ප්‍රශ්න, ගැටළු ආ කළ තමන්ට තම සිත පාලනය කර ගැනීමට බැරි තත්ත්වයක් ඇති වේ. එවිට සිත කලබල වේ. සිත කලබල වන විට ඔබද කලබල වේ. ඉන්පසු අලස බව ඇතිවේ. මේ ආකාරයට කටයුතු සිදුවීම නිසා ධාරණ ශක්තිය ඔබගෙන් පිරිහී යයි. මේවාට ප්‍රධානතම හේතුව සිතයි. එබැවින් නුඹ සිත ශක්තිමත් කර ගත යුතුය.

ඔබ තවමත් පමා නැත. ඔබ තවමත් උසස් පෙල දී නාඹර මල් කැකුලක් ලෙස ගත හැක. උත්සාහ ගත හොත් ඔබට දැන් වුවත් ඔබ තුළ නව මිනිසකු ඇති කර ගත හැකිය.

මොහොතක් සිතන්න.

ඔබගේ ජීවිතයේ ඔබට නොයෙකුත් බාධක, අභියෝග එල්ල විය හැක. ඒවාට යට නොවී සිත ශක්තිමත් කරගතහොත් ඔබගේ ජය මාවත වැඩි ඈතක නොවන බව ඒකාන්තය.

විරූපී දළඹුවා ආකර්ශනීය සමනලයකු බවට පත්වනවා සේ මෙම ටික කාලය තුළ මහන්සිවී, කැපවී, තර්ක කරමින් අධ්‍යාපනයේ යෙදුනහොත් ඔබගේ අනාගතය මල්ඵල ගැන්වෙනු සක් සුදක් සේ පැහැදිලි වනු ඇත.

ඔබට ජය....

B.A.P.
R.C.C / Weeraketiya - 2013 A/L

STORY OF DETERMINATION

Naim Sulaymanoglu



පුතේ අපිට බැහැ අනෙක් අයව වෙනස් කරන්න. ඒගොල්ලන්ගෙ කටවල් වහන්නත් අපිට බැහැ. ඉවසන්න පුරුදු වෙන්න. එයාලත් එක්ක ප්‍රශ්න ඇතිකර ගන්න යන්න එපා. ඔයාගෙ මොකක් හරි දක්ෂකමක් ඇති. ඒක දියුණු කරගෙන ඉදිරියට යන්න හිතන්න.

නදුන් අමන්ද මහමේන්ද්‍ර ආරච්චි | nandunamanda75@gmail.com

බල්ගේරියාවේ පතල් කම්කරුවෙකු විදිහට සේවය කළ තුර්කි ජාතිකයෙකුගේ හා ඔහුගේ බිරිඳගේ ජීවිතයේ සතුටුදායකම දිනයක් උදාවුණේ 1967 ජනවාරි 23 වැනිදායි. ඒ ඔවුන්ට බොහොම හුරුබුහුටි පුතෙකු ලැබුණු නිසායි. ඔහුට නම් තැබුණේ නයිම් සුලෙයිමනොග්ලු ලෙසින්. ඔහු උපන්නේ බල්ගේරියාවේ කාඩ්සාලි පළාතේ ටිචාර් නම් ගම්මානයේදියි.

නායිම් කාලයත් සමග සම්පූර්ණ වියයුතු උස ප්‍රමාණයට ළඟාවුණේ නැහැ. තවත් විදිහකින් කිව්වොත් ඔහු වයසට සරිලන විදිහේ උසක් තිබුණු කෙනෙක් නොවෙයි. ඔහුගේ උස අඩි 4 යි අඟල් 10 යි. මීට හේතු

මගේ උස ගැන දුක් වෙමින් සිටියා නම් අදටත් කිසි කෙනෙක් මාව දන්නෙ නැහැ. මම ඉදිරියට යන්න මාවතක් තෝරාගත්තා. ඒ මාවත දිගේ ගිහින් අද මම ලෝකයේම කථාබහට ලක්වූ බර උසුලන්නෙක්.

වුණේ නයිම්ගේ මව ද උසින් අඩු කෙනෙකු වීමයි. ඇයගේ උස අඩි 4 යි අඟල් 7 යි.

සුදුසු කාලයේදී නයිම් බල්ගේ-රියානු පාසලකට යොමුකෙරුණා. මේ පාසල් ගමන නයිම්ට කිසිසේත්ම සතුටුදායක අත්දැකීමක් වුණේ නැහැ. ඒ, ඔහුගේ 'අසාමාන්‍ය උස' පදනම් කරගෙන අනෙක් දරුවන් ඔහුට උසුළු විසුළු කළ නිසායි. පන්තියේ බල්ගේ-රියානු ජාතික දරුවන් නයිම් ඇමතුවේ 'තුර්කි කොටා' ලෙසින්. එපමණක් නොවෙයි ඔවුන් නයිම්ට සමහර විට ගුටි බැට පවා එල්ල කළා.

"අනේ අම්මෙ, මට නම් බැහැ මේ විදිහට අපහාස විඳ විඳ ඉස්කෝලෙ යන්න. මම ගෙදර නවතිනවා." නයිම් එසේ කීවේ බොහොම කලකිරුණු සිතින්.

"පුතේ අපිට බැහැ අනෙක් අයව වෙනස් කරන්න. ඒගොල්ලන්ගෙ කටවල් වහන්නත් අපිට බැහැ. ඉවසන්න පුරුදු වෙන්න. එයාලත් එක්ක ප්‍රශ්න ඇතිකර ගන්න යන්න එපා. ඔයාගෙ මොකක් හරි දක්ෂකමක් ඇති. ඒක දියුණු කරගෙන ඉදිරියට යන්න හිතන්න.